සාධු දැක්ම -1

THE EXCELLENT VIEW

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

සාධු දැක්ම

The Excellent View

MRS: K. SEETHA N. GOONETILLEKE
DIRECTOR
Perera Memorial Scholarship Foundation
2, Perera Mawatha,
...wegoda - Rajagiriya.
Tel: 011...

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

© අයිතිය සම්පාදක සතුයි

ප්‍රථම මුද්‍රණය - 2007

ISBN 978-955-50082-1-1

කර්තෘ ගේ වෙනත් පොත්

මා පිය ගුණ සමර - මුද්‍රණය 2006
(බුද්ධ වර්ෂ 2550 වෙසක් පුර පසළොස්වක දින සම්බුද්ධ ජයන්තිය වෙනුවෙන්)

මුද්‍රණය
හර්ෂණ ප්‍රින්ටර්ස්
222/7, පළමු පටුමග,
කලපළුවාව,
රාජගිරිය.

පිදුම

යහගුණ සහ කුසලතාවයන් වඩාත් ඔප් නංවමින්,
සමාජයට මාහැඟි මෙහෙයක් ඉටු කිරීම සඳහා
උතුම් මගකට මා යොමු කරවූ
අති උතුම් සංඝ පීතෘන් වහන්සේලාටත්...

මා මෙලොවට බිහිකර අසීමිත සෙනෙහසකින් යුතුව,
බොදු හැඟුම් මාගේ හද තුළ ජනිත කරවමින්
මා හදා වඩා
ගුණ නැණ බලයෙන් මා පෝෂණය කළා වූ
ආදරණීය මෑණියන්ට සහ පියාණන්ටත්...

දහස් සංඛ්‍යාත දරු දැරියන්ගේ නැණ පහන් දැල්වීමට හැකි
වෘත්තීමය ක්‍ෂෙත්‍රයකට මග හෙළිකර දුන්,
මාගේ දයාබර ගුරු දෙමාපියන්ටත්...

බැතිබර සෙනෙහසින් පිදේ.

හැඳින්වීම

"ඒක පුග්ගලො භික්ඛවෙ ලෝකේ උප්පජ්ජමානෝ උප්පජ්ජති බහුජන හිතාය බහුජන සුඛාය, ලෝකානුකම්පාය, අත්ථාය හිතාය සුඛාය දේවමනුස්සානං. කතමො එකපුග්ගලො, තථාගතො අරහං සම්මා සම්බුද්ධො."

"මහණෙනි, එක් පුද්ගලයෙක් ලෝකයේ උපදින්නට සමත්වන්නේ ඒ උතුමෝ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ට වැඩ පිණිස, හිත පිණිස සුව පිණිස උපන්නේවෙයි." (අංගුත්තර නිකාය - ඒක පුග්ගල වර්ගය)

ලෝකයට මහත් වූ ශාන්තිය පිණිස පහළවන ඒ තථාගත බුදු රදාණන් නුවණින් දැකීමට නම්, ඒ බුදුරදුන්ගේ ධර්ම මාර්ගය අවබෝධයෙන්ම අනුගමනය කල යුතුය. ඒ අනුගමනය කළ යුතු සදහම් මග, ත්‍රිවිධ ශාසනය වූ පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේධ ඔස්සේ විහිදී පවතී. පර්යාප්ති නම් දහම් ශ්‍රවණය, කියවීම, සාකච්ඡාව සහ විමසා බැලීමයි. ප්‍රතිපත්ති නම් අවබෝධ කරගත් ධර්මය ප්‍රතිපත්තියෙහි වැඩීමයි. ප්‍රතිවේධ නම් කෙලෙසුන් අත් හැරීම දක්වාම ප්‍රතිපත්තියෙහි ගමන් කිරීමයි.

"පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි" නුවණ ඇත්තන් විසින්ම අවබෝධ කරගත යුතු බව වදාළේ එබැවිනි.

ඉංග්‍රීසි ආචාරිනී, ශ්‍රී ලංකා -කැනඩා ශිෂ්‍යත්ව පදනමේ සම්බන්ධීකරණ ලේකම් කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මහත්මිය විසින් රචිත **"සාධු දැක්ම"** - **The Excellent View** - නම් කෘතිය, තථාගත බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය නිවැරදිව නුවණින් දකින්නට හා ප්‍රතිපත්තියෙන් බුදුරදුන් පුදන්නට සරල බසින් කරන ලද ආරාධනයකි. සැදැහැවත් බෞද්ධයන් විසින් සිත්හි උපදනා සැදැහැ ගුණ, වදනින් ශබ්ද නගා පවසන **"සාධු"** වචනයේ පටන් තෙරුවන් ගුණ සජ්ඣායනාව හා චතුරාර්ය සත්‍ය දක්වාම විමර්ශනාත්මකව පදින් පද හා පෙළින් පෙළ ගද්‍ය සහ පද්‍ය රචනය තුළින් අර්ථ විවරණය කොට ඇත. මෙම සරල සිංහල ධර්ම ග්‍රන්ථයෙහි විශේෂත්වය වන්නේ ඇවැසි තැන ඉංග්‍රීසි වචනයන්ද ගෙන හැර දක්වා හැබෑ අර්ථය මතුකොට දක්වන්නට උත්සාහවත් වීමයි. වර්තමාන අධ්‍යාපනය පුළුල් හා ගැඹුරු ලෙස ලෝකයම ආවරණය කරමින් දැනුම ලබාදීමට සංවිධානය වී ඇත. ලෝක ප්‍රජාවම ප්‍රධාන වශයෙන් සම්බන්ධීකරණය වන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි. මේ නිසා බුදු දහම

කතුවරියගේ පළමු ග්‍රන්ථය වූ **"මා පිය ගුණ සමර"** නම් වූ සෙනෙහෙබර දියණියකගේ පියගුණ ආවර්ජනාවෙන් ඇරඹී ග්‍රන්ථකරණය, **"සාධු දැක්ම"** (The Excellent View) මගින් වඩාත් පෙරට ගමන්කොට ඇත. සිත් නොසන්සුන් වෙමින් බොහෝ ජීවිත අවුලට හා වියවුලට පත්වෙමින් පවතින ජන සමාජයකට මෙම ධර්ම ග්‍රන්ථය එමග අවුරා සිත් ධර්ම මාර්ගයටම සමීප කරවීමට යම් පමණක හෝ උදාර දායකත්වක් දරනු ඇත.

ශ්‍රී ලංකා අධ්‍යාපන ක්ෂෙත්‍රයෙහි, දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීමෙන්ද, ඉතාමත් දක්ෂ එහෙත් ආර්ථික අපහසුතා ඇති උසස් පෙළ හදාරන දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩ පිළිවෙලකට ගෞරවණීය ලෙස දායක වීමෙන්ද, මා පිය ගුණ සැමරීම සඳහා වෛද්‍ය ශිෂ්‍යත්ව ක්‍රියාදාමයක් ආරම්භ කිරීමෙන්ද, සීතා නන්දනී ගුණතිලක මැතිණිය සිදුකරන්නා වූ ආගමික, සමාජයීක හා අධ්‍යාපනික මෙහෙවරට මෙම ධර්ම ග්‍රන්ථ රචනයද එක්වීම ප්‍රශංසා කටයුතුය.

සැමට චතුරාර්ය සත්‍ය අවබෝධය පිණිසම හේතුවේවා !!!

උතුම් තෙරුවන් සරණයි.
ආචාර්ය පූජණීය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ
සිරි සුදසුන් මහ වෙහෙර,
බත්තරමුල්ල

සම්පාදකගෙන්.............

2550 ශ්‍රී සම්බුද්ධ ජයන්තිය උදා වූ දා වෙසක් සඳ කිරණින් ශ්‍රී ලංකා වාසීන්ගේ බොදු හදවත් ඔකඳ වූ මෙහොතක, සදහම් සිසිලේ පහස ලබමින් මාගේ කුළුදුල් ග්‍රන්ථය වූ **"මා පිය ගුණ සමර"** ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත පිළිගන්වන්නට ලැබීම, කෙටි කාලයක් තුල මා දැරූ අප්‍රතිහත ධෛර්යයක සාර්ථක ප්‍රතිපලයක් විය. එහි සාර්ථකත්වය අගය කල උන් වහන්සේ, තව දුරටත් පොත් රචනා කිරීමට ශක්තිය, ධෛර්යය හා ආශීර්වාදය මා වෙත ලබා දුන්හ. බුදුන් වහන්සේගේ පිරිනිවීමෙන් වසර 2550 ක් ඉක්ම යන මෙවන් මෙහොතක සම්මා සම්බුදු රජාණන් වහන්සේ දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මයේ චිරස්ථිතිය පිණිස දහම් පොත් එළි දැක්වීම කාලෝචිත බව පෙන්වා දුන් උන් වහන්සේ ඒ සදහා **"බුදුන් දැකීම"** යන සංකල්පය ද මා වෙත යොමු කල සේක.

"බුදුන් දැකීම" පිළිබඳව ග්‍රන්ථයක් රචනා කිරීම විශාල අභියෝගයක් ලෙසින් ආරම්භයේ දී පෙනී ගියද කෙසේ හෝ එම අභියෝගය ජය ගැනීමට මම අදිටන් කර ගතිමි. බුදුරජාණන් වහන්සේ ශ්‍රී මුඛයෙන් දේශනා කොට වදාළ අති රමණීය වූත්, නිර්මල වූත් ඒ ශ්‍රී සද්ධර්මස්කන්ධයෙන් අල්ප මාත්‍රයක් හෝ පුහුදුන් ජනතාවගේ අවබෝධයට පහසු වන ආකාරයෙන් එළි දක්වමින් මෙම ග්‍රන්ථය රචනා කිරීම සදහා අනතුරුව මා සුදුසු ප්‍රවිෂ්ඨයක් සොයන්නට වීමි.

තරමක් ගැඹුරින් අවධානය යොමු කලයුතු මාතෘකාවක් ලෙස හැඟී ගිය නමුත්, කෙසේ හෝ කරුණු එක් රැස් කොට අප්‍රමාදව මෙම ග්‍රන්ථය රචනා කල යුතු බව මට අවබෝධ විණි. "දැකීම" යන සාමාන්‍ය ව්‍යවහාරයේ තිබෙන වචනය විවිධ අර්ථයන් ගෙන දෙන්නක් ලෙසට ශබ්ද කෝෂ වල නිර්වචනය කර තිබුණද මෙම සුවිශේෂ වූ දැකීම නිර්වචනය කර ගැනීම සදහා මම බොහෝ සේ වෙහෙසුණෙමි. ධර්ම ග්‍රන්ථ ගණනාවක් ඒ සදහා පරිශීලනය කළෙමි. පාලි බසින් මුද්‍රිත ධර්මය **-සාධු-** යන වචනයේ සිටම ගැඹුරු ගාථා ධර්මයන් දක්වාම සිංහල ඉංග්‍රීසි ද්විභාෂාවන්ගෙන් නිර්වචන සොයමින් සියළුම ගාථා ධර්මයන් උච්ඡාරණයත් සමගින් අර්ථ රසය හදවතට දැනෙන සේ ඉදිරිපත් කිරීමට මා වෙහෙස ගතිමි. අවබෝධයකින් යුතුව නුවණින් දැක හදවතින්ම ධර්මය දකින්නෙකුට එතුළින්ම, මෙම ශ්‍රේෂ්ඨ දැක්ම - **බුදුන් දැකීම** - අත් දැකිය හැකි බව මටම ප්‍රත්‍යක්ෂ විණි.

බොහෝ විට ගිරවුන් මෙන් වාග් මාලාව පමණක් කටට හුරු කර ගනිමින් කට පාඩමින් පාලි ගාථා පාඨයන් අප බෞද්ධ ජනතාව ශබ්ද නගා සජ්ඣායනා කරන නමුත්, ඒවායේ අර්ථ රසය හඳුනන්නෝ ඉතා සීමිතය.

-**සාධු**- යන වචනයේ සිට මහත් හඬකින් ගාථා සජ්ඣායනා කරන වත්මන් සමාජයේ පුහුදුන් බහුතරයකගේ සදහම් පිපාසය සංසිඳුවීමට මෙහි අන්තර්ගත කරුණු වලින් ලබාන්නා වූ අර්ථාවබෝධය ඉවහල් වනු දැක්ම මාගේ අභිලාෂයයි.

පාඨක ඔබ ගේ අවධානය සඳහා, අති මහත් කර්යය භාරයක් හමුවේ මෙම **"සාධු දැක්ම"** - **The Excellent View** - නම් වූ ග්‍රන්ථයෙහි "හැඳින්වීම" සකස්කර දීමට කාරුණික වූ, ශ්‍රී ලංකා-කැනඩා ශිෂ්‍යත්ව පදනමේ පුරෝගාමී සහ ගරු අනුශාසක ධූරංධර ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේට පළමු කොටම මාගේ භක්ති පූර්වක කෘතඥතාවය පුද කරමි.

මෙම ග්‍රන්ථයේ පසු පිට සකස් කර දුන් ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම් බී. ජී. කරුණාරත්න මැතිතුමාට ද මාගේ ගෞරවණීය ස්තුතිය පුද කරමි.

පිටකවරය ඉතාමත් අර්ථාන්විත ලෙසින් නිර්මාණය කර දුන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සැලසුම් ශිල්පී ප්‍රියන්ත මිරිහාගල්ල මහතාටත් මුද්‍රණ කටයුතු කලට වේලාවට, ක්‍රමවත් ලෙස ඉටු කරදුන් හර්ෂණ ප්‍රින්ටර්ස්හි අධිපති සුදත් වීරසිංහ මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතවේදීතාවය ඉතසිතින් පුදකරමි.

මාගේ සමාජ සේවා හා ලේඛණ කටයුතු සඳහා ප්‍රමාණවත් නිදහසක් හා පහසුකම් ද මා වෙත ලබා දෙන අතරතුරදීම දෛනික ගෘහමය කටයුතු හමුවේ ඉතා උපේක්ෂාවෙන් කටයුතු කරමින් මෙම ග්‍රන්ථය පාඨක ඔබ අතට පත් කරනා තුරුම මා වෙත අනුපමේය සහායක් දැක්වූ මාගේ ආදරණීය ස්වාමිපුරුෂයා වූ නිමල් ගුණතිලක මහතාටත්, අප පුතණුවන් දෙදෙනාටත් මාගේ හෘදයාංගම ස්තුතිය පිරි නමමි.

සාධු දැක්ම තුළින් සදහම් සිසිල් සුවයේ පහස විඳින ඔබ සැමට ද මාගේ ස්තූතිය පිරි නැමේ.

මෙයට,

දහම් ලැදි,

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

392/2,පෙරේරා මාවත,
කොටුවේගොඩ
රාජගිරිය
දුරකථන : 0112877950

පටුන

		පිටුව
1.	දැකීම හෙවත් දෘෂ්ඨිය	01
2.	ප්‍රඥා මහිමය	04
3.	සාධු ! දැක්ම	06
4.	නමස්කාරය	09
5.	ත්‍රිවිධ රත්නයේ සරණ යාම	12
6.	බුද්ධාලම්භන ප්‍රීතිය	16
7.	පංචශීලය	18
8.	බුදු ගුණ දක්ම-බුදුන් වැඳීම	21
9.	සදහම් දැක්ම-දහම් වැඳීම	26
10.	සංඝ රත්නය-සඟුන් වැඳීම	29
11.	ගුරු දෙගුරු නමැදීම	31
12.	ත්‍රි ලක්‍ෂණය හා නිවන් මග	36

1. දැකීම හෙවත් දෘෂ්ඨිය

අපි පියවි ඇසින් එදිනෙදා ජීවිතයේදී බොහෝ දේ දකින්නෙමු. කිසියම් සත්වයෙක්, කිසියම් දෙයක් හෝ කිසියම් ස්ථානයක් මෙලෙසින් අපගේ දර්ශන පථයට හසු වූ විට අපි එය දුටු බව දනිමු. තවත් අයෙකුට පෙන්වීමට, දැකීමට අවස්ථාව සලසා දීමට වුවද අපි ඉදිරිපත් වන්නෙමු. මෙය ඉතා සරල දැක්මකි.

එහෙත් අපට දැකිය හැක්කේ අපගේ නෙතට ගෝචර වන දේ පමණක්ම නොවේ. යමෙක් පසුගිය සිදු වීමක් සිහිපත් කරමින් .... එදා අර රැස්වීමට ඇවිත් හිටපු ජනතාව............. එසේත් නැතිනම් මම එදා ඔබගේ කාර්යාලයට එන විට ඔබගේ මේසය මත තිබූ ලිපි ගොනු............. ආදී වශයෙන්.........ප්‍රකාශ කළහොත් ඔබ ක්ෂණිකවම එම අවස්ථාව දකී. ඇතැම් විට ඔබ...........අර.....මා ළඟින්ම සිටිය තැනැත්තා............. අර කහ පැහැති කමිසයක් ඇඳ සිටියේ.......... ආදී වශයෙන් ප්‍රකාශ කරමින් මනසේ ඇති වූ එම දර්ශනය විනිවිද දකින්නත් පුළුවනි. ඔබ ඒ සිද්ධීන් දුටුවේ ඔබගේ මාංශමය ඇසින් නොවන බවත්, ඔබගේ සවන් ගැටුණ ශබ්ද තරංග මනැසට ගෝචර වීම නිසා ඇති වූ දෘෂ්ඨියක් හෙවත් චක්ඛු විඤ්ඤාණය නිසා බවත් ඔබටම ප්‍රත්‍යක්ෂවනු ඇත.

මෙලෙසින් උදා වූ අතීත අවස්ථා මෙන්ම උදා නොවූ අවස්ථා ද ඇතැම් විට අපි දකින්නෙමු. හෙට සම්මුඛ පරීක්ෂණයට යන හැටි.........වේදිකාවක් මත දී කෙනෙකුට මල් මාලාවක් පළඳවන හැටි............ නොඑසේ නම් තව දින කිහිපයකින් ගුවන් ගත වන හැටි.... ආදී වශයෙන් අපි මනැසින් දක්නා දේ බොහෝය.

තාක්‍ෂණ දියුණුවත් සමග ඉදිරියට යන ලෝ වැස්සන් අද ද්විමාන හෝ ත්‍රිමාණ තල ඔස්සේ එක් වරම ප්‍රකෘති ඇසට නොපෙනෙ දෙයක්, තත්පර කිපයක් පියවි දෘෂ්ඨිය නාභිගත කර තැබීමෙන් මිනිස් ඇසේ දෘෂ්ඨි විතානය මත පතිත කරවීමට සමත් වී ඇත. එහෙත් **බුදුන් දැකීම** මෙම කිසිදු දැක්මකට සම කල නොහැක්කේමය. මෙම සුවිශේෂ දැක්ම ද්විමාන හෝ ත්‍රිමාණ තාක්‍ෂණික රූප රාමු මගින් කොතෙක් උත්සාහ දැරුවද ප්‍රකෘති ඇසට ගෝචර වන අන්දමේ රූපයක් නොවීම එයට හේතුවයි.

එය දැකිය හැක්කේ ධර්මය තුලින් පමණක්ම බව ලොව පහල වූ ශ්‍රේෂ්ඨතම විද්‍යාඥයා මෙන්ම දාර්ශනිකයා වූ අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ ශ්‍රී මුඛයෙන්ම මෙසේ වදාළහ.

සෝ ධම්මං පස්සති - යෝ මං පස්සති
(ධර්මය දැකීම බුදුන් දැකීමයි.)

ඒ අනුව මෙම ශ්‍රේෂ්ඨ දැක්ම අප බුදුරජාණන් වහන්සේගේ අපරිමිත ගුණ කඳ තුලින්ම දිස්වන්නා වූ සද්ධර්ම කිරණ මනස තුල පතිත වීමෙන් නුවණින්ම දැකිය යුතු ප්‍රඥාවට ගෝචර වන්නක්ම වන්නේය. අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පරිනිබ්බානයෙන් වසර 2550 ක් ගත වී ඇති මෙවන් යුගයක උන් වහන්සේගේ ජීවමාන රූප කාය දක්නට නැතත්, ජීවමාන ධර්ම කාය ලෝ තලයේ සදාකල්හිම විරාජමානව පවතී. එය තම තමන්ගේ නැණ පමණින් දියුණු වූ ප්‍රඥාව තුළින්ම දෘෂ්ඨි ගත වනු ඇත. එම දැක්ම සඳහා අවශ්‍ය වන මූලික සාධකය වන්නේ තම චිත්ත සන්තානය තුල **ශ්‍රද්ධාව** ඇති කර ගැනීමය. **ශ්‍රද්ධාව** යන පදය නොයෙකුත් ශබ්ද කෝෂයන්හි විවිධ අර්ථ නිරූපණ මගින් සවිස්තරාත්මකව විග්‍රහ කර ඇති පදයක් වුවත්, අපගේ අවධානය සරලව හා නිවැරදිව යොමු කිරීම මේ අදියරේදී ප්‍රමාණවත් විය හැකිය. මෙය confidence/ faith / belief වැනි සරල ඉංග්‍රීසි වචන ඔස්සේ තේරුම් ගැනීම වඩාත් පහසු වනු ඇත. ත්‍රිවිධ රත්නය කෙරෙහි කුමන ආකාරයේ හෝ සැකයකින් තොරව හේතු ඵල ධර්මතාවයන් පිළිබඳව ඇති කරගන්නා වූ භක්තියක්, ඇදහීමක් සහ විශ්වාසයක් ලෙසින් **ශ්‍රද්ධාව** හඳුනාගත හැකිය. එය වූ කලී ඉතාමත් නිර්මලව තම චිත්ත සන්තානය තුල පහලවන්නා වූ අති පාරිශුද්ධ වූ ශක්තිමත් හැගුම් සමුදාවලියකි.

අප අවබෝධයකින් යුතුව දෙසවණින් ශ්‍රවණය කරන ධර්මය, හදවත තුල දෝංකාර දෙන සෑම මොහොතකම ඇතිවන චිත්ත ප්‍රසාදය තුලින් ඇතිවන්නේ විශාල සැනසීමකි. එසේ නම් ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කිරීමේදී එය

පැහැදිලිවම අවබෝධ කටයුතුමය. සවණ ගැටුන ධර්මය නුවණින් විමසා බලා තේරුම් ගැනීමට කවරෙකුට හෝ කිසිදු බාධකයක් නොමැති අතර ප්‍රඥාව මතම අවබෝධය රඳාපවතිනු ඇත. එනම් කුමන තරමේ ප්‍රඥාවක් කෙනෙකු සතු වේද ඒ ප්‍රමාණයට සාපේක්ෂව ඔහු තුල ධර්මාවබෝධය බලපවත්වනු ඇත. ඒහි පස්සික ගුණයෙන් යුතු වූ මෙම ධර්මය දැකීමට ධර්ම මාර්ගයටම අවතීර්ණ විය යුතු අතර එය පැහැදිලි ලෙස අවබෝධ වන තුරුම විමසිලිමත් විය හැකිය. සවන් ගැටුණ පමණින් හෝ පොතක දුටු පමණින් හෝ ධර්මය පිළිගත යුතු යැයි ශ්‍රී සද්ධර්මයේ කිසිදු ස්ථානයක නියෝග පනවා නැත. ඉතා විමසිලිමත්ව යථාර්ථවාදීව කරුණු සොයා බලන්නෙකුට ධර්මයේ සත්‍යතාවය ඉතා සියුම් ලෙස වැටහෙන අතර එම වටහාගැනීමේ ප්‍රවණතාවය **බුද්ධියට** සාපේක්ෂ වන්නේමය. බුද්ධිය intellect යනුවෙන් ඉංග්‍රීසි බසින් අරුත් දෙන අතර faculty of knowing ,reasoning & understanding යනුවෙන් ශබ්ද කෝශයන්හි අර්ථ විග්‍රහයන් දක්වා ඇත.

දැකීම යන්න බොහෝ වූ අර්ථ නිරූපනය කරයි. ඉංග්‍රීසි Oxford Dictionary හි ද, See යන වචනයට Understand යනුවෙන්ද අර්ථ විග්‍රහයක් දක්වා ඇත.

Oh!,.........I see........... යනුවෙන් කෙනෙක් පවසන්නේ යමක් දෙනෙතින් අරමුණු කරගෙන නොවේ. මෙයින් ධ්වනිථාර්ත වන්නේ පැහැදිලි අවබෝධයකි.

දැකීම හෙවත් **දෘෂ්ඨිය** අපට vision යන වචනයේ අර්ථ නිරූපන අනුව බැලීමෙන් වඩාත් පැහැදිලි කර ගත හැකියි. reflection, mirror image වැනි වචන වලින් අර්ථ නිරූපනය කර ඇති මෙම දෘෂ්ඨිය හෙවත් දැකීම, යමක් පිළිබඳව ඕනෑකමින් සිතා බලන විට මනැසින් දකින ප්‍රතිබිම්බය හෙවත් මනැසට පරාවර්තනය වන දේ තුලින් දැකිය හැකි දෘෂ්ඨියක් ලෙසද පෙන්නුම් කරයි. එහෙත් වඩාත් ගැඹුරින් සලකා බැලීමේදී එය ප්‍රත්‍යක්ෂ වීම, ප්‍රායෝගික දැනුම තුලින් ලබාගන්නා වූ යථාවබෝධය මත වර්ධනය වන විනිවිද දක්නා ඥාණය සහ නුවණින් දැකීම ලෙසින් අවබෝධ වනු ඇත. ඒ වූ කලී gump-tion, acumen, discretion, prudence වැනි වචන වලින් අර්ථ විග්‍රහ කර ඇති ප්‍රඥාවට ගෝචර වන ඉතාමත් සියුම් වූ තීක්ෂණ දැක්මකි.

2. ප්‍රඥා මහිමය

ප්‍රඥා මහිමය වූ කලී අති ශ්‍රේෂ්ඨ වූ ත් දෙව් බඹුන් පවා මවිත කල වූත් අසම සමවූත් ධර්මතාවයකි. එය අති ශ්‍රේෂ්ඨ මෙන්ම විනිවිද යන වැටහීම් ශක්තියක් යනු වෙන්ද නිර්වචනය කල හැකියි. ප්‍රඥාව වූ කලී කිසිවෙකුට ධනය, බලය මගින් ලබා ගත හැකි දෙයක් නොවන්නේමය. එය ග්‍රහණය කර ගත හැක්කේ ශීල, සමාධි, ප්‍රඥා යන ධර්ම මාර්ග ඔස්සේ චිත්ත ශක්තිය දියුණු කර ගැනීමෙන්ම පමණි.

ස්ථිර අධිෂ්ඨානයක්, අප්‍රතිහත ධෛර්යයත්, මාහැඟි කැපවීමත් මත ප්‍රඥාව මෙහෙයවන්නෙකුට ලද නොහැකි ජයග්‍රහණයක් නොමැති බව සිදුහත් චරිතයෙන්ම අපට මනාව පසක් කර ගත හැකිය. සා අවුරුදු දුෂ්කර ක්‍රියා සමය අතහැර ශ්‍රී මහ බෝධිය අසලට පැමිණි සිදුහත් තවුසාණෝ එහි පාමුල වැඩ හිඳ කර්මස්ථාන වඩමින් උපදවාගත්තා වූ ධ්‍යාන හමුවේ පූර්වේනිවාසානුස්මෘති ඥානයේ සිට අදියරෙන් අදියර ප්‍රඥාව මෙහෙයවමින් සර්වඥතාඥානය අවබෝධ කරගත් ආකාරය බෞද්ධ ඉතිහාසය මනා ලෙස විදහා දක්වයි.

බොහෝ ජාතක කථා වල විවිධාකාර වූ සමාජයීය තත්වයන් හමුවේ, අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ බුදු ප්‍රඥා බලමහිමය විදහා දැක්වෙන්නේය. උන්වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පෙර ආත්මභාවයන්හි ගත කල ආකාරය ජාතක කථා තුලින් එළි දක්වා ඇති අතර ඒවා තුලින් අපට ලද හැකි ආදර්ශයන් අති මහත්ය. එම කථා වස්තූන් දෙස

නුවණින් සලකා බැලීමේදී ඒ එක් එක් සිද්ධීන් තුළින් එළි දැක්වෙන ආදර්ශයන් එදා සමාජයට කෙතරම් සාර්ථක ලෙස බලපෑවේද යන්නත් අද සමාජයට කෙතරම් අර්ථවත් ලෙසින් ගෝචර වන්නේද යන්නත්, මනාව පැහැදිලි වනු ඇත.

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කල ධර්මස්කන්ධයම අකාලිකය. ජීවමානවම පවතින්නේමය. සංසාර ගමනේ අතරමංව තවමත් සැරි සරන අපට ඒ ශ්‍රී සද්ධර්මය දැකීමට කිසිදු බාධකයක් නැත.නීති රීති නැත. ඉතාම දුර්ලභ ගණයේ මනුෂ්‍ය ආත්මයක් ලබා ගැනිමට සංසාර ගමන පුරාම එක් රැස් කරගත්තා වූ කුසල් සම්භාරය හේතු වී ඇත. අප පමා වී ද නැත. අප්‍රමාදව ආරම්භ කළ යුත්තේ **අවබෝධයකින් යුතුව** තිසරණ සරණ යාමෙනි.

අකාලිකව විශ්වයේ පවත්නාදේ සත්‍ය ලෙසින් අවබෝධ වන විට ශ්‍රද්ධාව පහල වේ. අනතුරුව දෛනිකව රැකිය හැකි පංච ශීලය වචන වලට පමණක් සීමා නොකොට අවබෝධයත් සමග අර්ථාන්විතව ආරක්‍ෂා කල හැකිය. ගිරවුන් මෙන් කටට හුරුවූ පද පහක් කීමෙන් නොව හදවතට දැනෙන සේ ගාථා ධර්මයන් අවබෝධ කරගත යුතුය. **අවම වශයෙන් මව්-පිය නමැදීමේදී ද උච්ජාරණය කරන ගාථා පාඨයන්හි අර්ථය දැකිය හැකි නම් එමගින් ලැබිය හැකි දෙමාපිය ආශීර්වාදය වඩාත් ප්‍රබල වනු ඇත.**

ධර්මය තුලින් බුදුන් දැකීමට නම්, අප නිරතුරුවම හඬනගා ප්‍රකාශ කරන ගාථා පාඨයන් අවබෝධ කටයුතුමය. උන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය ජීවමානවම අප අසලම පවතිද්දී, උත්සාහ ගන්නේ නම් අපට ධර්මාවබෝධයෙන් ලබන ප්‍රඥාව තුලින් බුදුන් දැකිය හැකියි. ඒ සඳහා කල යුතුව ඇත්තේ අප විසින් උච්ජාරණය කරන සියළුම ගාථා ධර්මයන්ගේ ගේ අදහස, **අර්ථරසය** අප හදවත හඳුනාගෙන ඇත්ද යන්න අප විසින්ම නිර්ණය කිරීමයි. ධර්මයෙහි ඇති වැදගත්ම රසය වූ ඒ අර්ථ රසය අප හදවතට දැනී ඇති දැයි ඉතා සරලව මෙසේ සොයා බලමු.

3. සාධු දැක්ම

සාධු !!! හඬ

ඔබ ආරාමයකට ගිය විට චෛත්‍යරාජයාණන් ඉදිරියේ හෝ වේවා! බෝ සමිඳු ඉදිරියේ හෝ වේවා! බුද්ධ ප්‍රතිමාවහන්සේ ඉදිරියේ හෝ වේවා! දෑත් නළලේ බැඳ, ගෞරව සම්ප්‍රයුක්තව ශීර්ෂ ප්‍රණාමයෙන් යුතුව පළමුවෙන්ම තෙවරක් ප්‍රකාශ කරන්නේ කුමක්ද?

ඒ **සාධු ! සාධු !! සාධු !!!** යන හඬ බෞද්ධ අපගේ දෙසවන් වලට ඉතාම හුරු පුරුදුය. පෙරහැර පිංකම් ආදිය පවත්වන ස්ථාන වල මෙම හඬ ඔල්වරසන් (enthusiastic response) දෙනු ඇත. එහෙත් එම සාධු හඬ ඇසෙන සෑම වාරයකම, නැතහොත් අපගේ මුවගින් එම හඬ නිකුත්වන සෑම වාරයකම එහි අර්ථය අප හදවත තුල සජීවී ලෙස දෝංකාර දෙන්නේද? එහි අර්ථය පිළිබඳ අවබෝධයක් නොමැති විට එය හුදු අකුරු දෙකකින් සැදුම්ලත් වචනයකට පමණක් සීමා වනු ඇත. සම්ප්‍රදායිකව පැවතගෙන ආ වචනයක් ලෙසින් එය පිළිනොගෙන විචාරශීලී විවෘත මනසකින් එය අවබෝධ කටයුතුමය. ධර්මයට අදාල කිසිදු කරුණක් විමසිලි නුවණින් සලකා බලා මිස පිළිගතයුතු යැයි කිසිම ස්ථානයක කිසිම ආකාරයේ බලපෑමක් බුදු දහමේ නැත.

එසේ නම් **සාධු** යන්නෙහි අර්ථය ගැන අපි මොහොතක් සිතමු. යහපත්, උසස්, උතුම්, ශ්‍රේෂ්ඨ යන වචන වලින් අපට එය නිර්වචනය කල හැකියි. එහෙත් වචනයේ අර්ථය දත් පමණින් ද අප සෑහීමකට පත්විය යුතු නැත. එම අර්ථය දෙස දැන් අපි නුවණින් බැලිය යුතුය. එසේ නොමැතිව අන්ධානුකරණයෙන් වාග්

මාලාව පමණක් ප්‍රගුණ කරගැනීම, මේ තරම් උසස් වූ මනසක් ඇති මිනිස් වර්ගයාගේ ධර්මාවබෝධය සඳහා ප්‍රමාණවත් නොවන්නේමය.

Excellent ! Excellent !! Excellent !!!

ශ්‍රේෂ්ඨයි ! ශ්‍රේෂ්ඨයි !! ශ්‍රේෂ්ඨයි !!!

මෙම ශ්‍රේෂ්ඨත්වය කුමක්දැයි අප විසින් අවබෝධ කටයුතුයි. සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ බුද්ධ තේජසින් ඔද වැඩී ගිය, සර්වඥතාඥාණයෙන් පිරී ඉතිරී ගිය, දෙව් බඹුන්ගේ පවා වන්දනීයත්වයට පාත්‍ර වූ අති පාරිශුද්ධත්වයෙන් අසම සම වූ එම **ශ්‍රේෂ්ඨත්වය** අප හද තුල සජීවී ලෙස දෝංකාර දෙනවිට අපගේ ප්‍රඥාව තුලින් දිස්වන්නේ අප තිලෝගුරු අමා මෑණියන් වහන්සේමය.

එම දැක්ම අපගේ පංච ඉන්ද්‍රියයන් මගින් ලබා දුන් රූ සටහන් හෝ, ත්‍රිමාන ආකෘති තල මත පිහිටන්නක් හෝ නොවේ. විකසිත වූ ප්‍රභාෂ්වර මනසක් මත පතිත වන ප්‍රඥා කිරණ මගින් දක්නා මෙම දැක්ම යථාර්ථ අවබෝධය පිණිසම වන්නේ ය.

ඇතැම් වැඩිහිටියන් විසින් කුඩා දරුවනට මෙම **සාධු !** යන ශ්‍රේෂ්ඨ වචනය සාවද්‍ය ලෙස හඳුන්වාදීම නිසා අද සමාජගත බොහෝ දෙනෙකු **සාධු** යන වචනයෙන් හඳුන්වනු ලබන්නේ ස්වාමීන් වහන්සේ නමකි. බෞද්ධාගම පිළිබඳව කිසිදු අවබෝධයක් නැති ඉතා කුඩා දරුවකුට බෞද්ධ සංකල්පය හඳුන්වා දීමට එම සරල වචනය භාවිතා කළේ වී නමුදු දරුවා නුවණින් මුහුකුරා යාමත් සමඟ නිවැරදි අවබෝධය ලබා දිය යුතුමය. එහෙත් නූතන සමාජගත මිනිසුන් අතරේ ඇතැමුන් සාවද්‍ය අදහස් දරුවන්ගේ හද තුලට දීම පමණක් නොව, ඇතැම් අවස්ථාවලදී .. "අන්න පුතේ සාධු කෙනෙක් - සාධු..ට **ට..ටා** කියන්න" **යනුවෙන් පැවසීමට තරම් අන්ධබාලවී ඇත්තේ භාෂා සංකලනය අන්ධානුකරණයෙන් යුතුව ආභරණයක් යැයි සිතා පැළඳගෙන ඇති බව නිර්ලජ්ජිතව සමාජයට එළි දක්වමිනි.**

විවිධ භාෂාවන්ගෙන් කැඩී බිඳී අර්ථ විරූපී ලෙසින් ව්‍යවහාරයට එක් වී ඇති .....**හායි**..........**බායි**......**ට**...**ටා**.... යන අර්ථ ශූන්‍ය වදන් වලට සීඝ්‍රයෙන් යොමු කරවනු ලබන වත්මන් දරු පරපුර එම ව්‍යසනයෙන් වලක්වා ලොව පවත්නා ශ්‍රේෂ්ඨතම සරණ වූ **බුදු සරණ** පැතීමට පුරුදු පුහුණු කරවීම වැඩිහිටියන්ගේ විශාල වගකීමක් වන්නේමය.අකුරුවලට පමණක් සීමා වූ අර්ථ ශූන්‍ය එක් වදනකින් පවා බාල පරම්පරාවක්ම නොමග යා හැකි බැවින් භාවිතයේ පවතින සෑම වචනයක් පිළිබඳවම යථාවබෝධයක් ලැබිය යුතුමය.

ශ්‍රී සද්ධර්මයේ යථානුරූපී ගුණ සුවඳ ග්‍රහණය කිරීමට ත්‍රිවිධ රත්නයේ නාමයෙන් කුඩා දරුවනට ඇති උරුමය රැක දීම වැඩිහිටි අප සැමගේ යුතු කමකි.

විවිධ භාෂා දැනුම අප විසින් ලැබිය යුතුයි.එහෙත් ඒ අන්ධානුකරණයෙන් නොවේ. ලබන්නා වූ භාෂාමය දැනුම විවිධ ජාතීන් සමග අදහස් හුව මාරු කර ගැනීමේදී ඉතා වැදගත්ය. අප විවිධ භාෂාවන් උගත්තේ වී නමුදු, එම භාෂාවන් නොදන්නා අය ඉදිරියේ බැරෑරුම් ලෙසට හසුරවමින්, අපට උරුම භාෂාව හෙළා දකිමින්, එය අවතක්සේරු කරමින් එසේත් නැතිනම් අමතක බවක් හුවා දක්වමින් අන්‍ය භාෂාවන් කරපින්නා ගැනීමට යත්ත දරන්නෝ සිදු කරනු ලබන්නේ ස්ව උත්සාහයෙන්ම තම බුද්ධියට නිගරු කරගැනීමක් පමණි.

මව් භාෂාව සිංහල වුත්, නිර්මල බුද්ධ ධර්මය තවමත් පවතින්නා වූත්, මෙම ශ්‍රී ලංකාද්වීපයේම ඉපිද හැදී වැඩී වසරකට හෝ වසර කීපයකට විදෙස් ගතවූ ඇතැමුන් සිංහල භාෂාව උච්චාරණයේදී එය විකෘති කිරීමට දරන්නා වූ වෑයම මොන තරම් නින්දිතද? භාෂාවන් උගත යුත්තේ අවශ්‍ය අවස්ථාවක දී හසුරුවාලීමටත්, වෙනත් භාෂාවන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත්, විදේශීය ජාතීන් සමඟ අදහස් හුවමාරු කර ගැනීමටත් විනා, එයට ගැති වීම අඥාණකමක්ම වන්නේය. **බුදුරජාණන් වහන්සේගේ දේශනයට අනුව අපි පාරුවක් පාවිච්චි කළ යුත්තේ ගඟකින් එගොඩ වීමට විනා, එගොඩවීමෙන් පසු එය කරගසාගෙන යාමට නොවන බවට අප දැනුවත් විය යුතුයි.**

4. නමස්කාරය

ශ්‍රේෂ්ඨත්වය හඳුනාගෙන දොහොත් මුදුන් නගා **සාධු!** නද දෙමින් බුදුන් දුටු අපි අනතුරුව අති මහත් වූ ගෞරවයකින් යුතුව නමස්කාර කරන්නෙමු.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

අප කුඩා කාලයේ සිට මේ දක්වා මෙම පාලි පාඨය අනන්ත වූ වාර ගණනාවක් ශ්‍රවණය කර ඇත්තෙමු. සජ්ඣායනය කර ඇත්තෙමු. එහෙත් එහි අර්ථය කුමන භාෂාවකින් හෝ වේවා හදවතට දැනුනේද? කියන්නේ කුමක් ද? ඇසෙන්නේ කුමක් ද? නුවණින් කල්පනා කර බැලුවේ නම් එතුලින් බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය වඩාත් පැහැදිලි ලෙසින් දෘෂ්‍යමාන වනු ඇත.

I forfeit my homage to the Exalted on, The worthy on, The Perfectfly enlightened One

සර්වඥතාඥානය නියත වශයෙන්ම අවබෝධ කරගත්, සියළුම පූජාවන් සඳහා සුදුසු වූ, තුන් ලෝකාග්‍රවූ ඒ ශ්‍රේෂ්ඨයාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

චෛත්‍ය රාජයාණන් වහන්සේ අබියස හෝ බෝ සමිඳු අබියස එසේත් නැතිනම් බුද්ධ ප්‍රතිමා වහන්සේ අභිමුඛව තෙවරක් දොහොත් මුදුන් තබා

සිදුකරනු ලබන මෙම **නමස්කාරය** කුමන භාෂාවකින් අර්ථය පැහැදිලි කිරීමට උත්සාහ ගත්තද, කලහැක්කේ එහි පුළුල් වූ යථාර්ථය සංකේතවත් කිරීමක් පමණි.

මෙහි **The Exalted one** යනුවෙන් ඒ තුන් ලෝකාග්‍රවූ ශ්‍රේෂ්ඨයාණන් වහන්සේ හඳුන්වා දී ඇති නමුත්, එම ශ්‍රේෂ්ඨත්වය හඳුන්වා දීමට ශබ්ද කෝෂ දස දහස් ගණනකින් අර්ථ විග්‍රහ ගෙන හැර පෑවේ වුවද ප්‍රමාණවත් නොවනු ඇත. **එම ශ්‍රේෂ්ඨත්වය ප්‍රඥාව තුලින් පමණක් විනිවිද දැකිය හැකි ධර්මතාවයක් විනා භාෂාමය වදන් මඟින් එළි දැක්විය හැකි, ග්‍රන්ථකරණයට ගෝචර වන්නක් නොවීම එයට හේතුවයි.**

මීළඟට **The Worthy One** යනුවෙන් පෙන්වා ඇත්තේ සියළුම පූජාවන් ලැබීමට සුදුස්සෙකු වී ඇති බවයි. Worthy යන පදය ඉංග්‍රීසි ශබ්ද කෝෂයෙහි (in oxford Dictionay) - person of some distinction in his .... charactreristic/ estimable of deserving respect යනුවෙන්ද අර්ථ විග්‍රහයන් ගෙන හැර පා ඇත. පාලි පාඨයෙහි **අරහතෝ** යනුවෙන් පෙන්වා දී ඇති මෙම **අරහං ගුණය** අති ගෞරවණීයත්වයට පාත්‍ර විය යුතු බුද්ධත්වයට පමණක් සීමා වූ සුවිශේෂී සුදුසුකමකි. තුන් ලෝකාග්‍ර වූ උන් වහන්සේ මනුෂ්‍ය ලෝක පමණක් නොව දිව්‍ය බ්‍රහ්ම ලෝක වලින් පවා පූජාවන් ලැබීමට හිමි කරගත්තා වූ මෙම සුදුසුකම අති ශ්‍රේෂ්ඨ වන අතර වෙනත් කිසිදු වදනකට එම **අරහං ගුණය** සම කල නොහැක්කේමය.

එහෙත් භාෂාවන් ඉතා සීඝ්‍රයෙන් විකෘති වෙමින් සෝදා පාළුවකට ලක්ව ඇති මෙවන් යුගයක අන්ධානුකරණයෙන් භාෂාවන් හසුරවන ඇතැම් අඥාණයින් විසින් එදිනෙදා කටයුතු වලදී මෙම **අරහං** යන ශ්‍රේෂ්ඨ වදන අනවබෝධයෙන් යුතුව, දැඩි අප්‍රසාදයක් ද්වේශ සහගතව ප්‍රකාශ කිරීමට යොදා ගන්නා අවස්ථා බොහෝය.

තමාගේ අහිතවතෙකු කිසියම් උවදුරකට පත් වූ අවස්ථාවක දී - සාධු සාධු - යැයි ප්‍රකාශ කරමින් ජය පැන් යැයි සිතා ගිල ගන්නා වූ වස විස මගින් සිදු වන අධ්‍යාත්මික පරිහානිය සහ ආගමික පරිහානිය ඉතා දරුණුය. එමෙන්ම, යම් ක්‍රියාවක් කෙරෙහි හෝ පුද්ගලයෙකු කෙරෙහි හෝ කිසියම් අප්‍රසාදයක් ඇති වූ විට "මට නම් ඔය වැඩය අරහං".. .. නැතහොත් "ඔය පුද්ගලයා නම් මට අරහං".. .. .. යනුවෙන් අනවබෝධයෙන් ප්‍රකාශ කිරීම කොතරම් ශෝචනීය ද?

සමාජගත ඇතැම් පුද්ගලයින් සාවද්‍ය ලෙසින් මෙවැනි වදන් ප්‍රකාශ කරන අවස්ථා වලදී උසස් වූ මනසකින් යුත් බුද්ධිමත් මිනිසා විසින් කල යුත්තේ එහි සාවද්‍යතාවය ඔවුනට පෙන්වා දෙමින් එවැනි ශෝචනීය තත්වයන් හෙළා දැකීම විනා පහත් රුචිකත්වයන් ඇති ඇතැම් අන්ධබාලයින් විසින් ලබන්නා වූ වින්දනයේ හවුල්කරුවන් වීම නොවේ.

යමෙකු තම අප්‍රසාදය ද්වේශ සහගතව ප්‍රකාශ කිරීමට යොදා ගත් "අරහං" යන පදයෙන් ධ්වනිථාර්ථ වී ඇත්තේ, තමා අරමුණු කරගත් දෙයට සහමුලින්ම පරස්පර විරෝදී වූ අදහසක් බව අවබෝධවනවාත් සමගම, තම බුද්ධියට සිදු කරගත්තා වූ අවමානය පිළිබඳව හෙතෙම ලාජ්ජාශීලී වනු ඇත. **ශ්‍රී සද්ධර්මයේ ගැබ්වී ඇති එම ශ්‍රේෂ්ඨ වදන්හි යථාර්ථය යටපත් කර සාවාද්‍ය ලෙසින් අනාගත පරම්පරාවට උරුම වීම වැලැක්වීම වැඩිහිටි බුද්ධිමතුන්ගේ යුතුකම වන්නේම ය.**

උක්ත ගාථා පාඨයෙහි අවසානයේ එන **සම්මා සම්බුද්ධස්ස** යන්න ඉංග්‍රීසි බසින් **The Perfectly enlightened One** යනුවෙන් අරුත් ගැනෙන නමුත්, එපමණකින් සෑහීමකට පත් නොවී විමර්ශනාත්මකව බැලිය යුතු යි. එසේ සොයා බැලීමට ශ්‍රී සද්ධර්මය තුල ඇත්තේ අසීමිත නිදහසකි. එබැවින් අප උත්සාහ කරන්නේ නම් සෑම ගාථා පාඨයකම අදහස නිවැරදි ලෙසින් අබබෝධ කර ගැනීම අපහසු නොවනු ඇත. එය මෙතරම් උසස් වූ මනසක් ඇති මිනිස් වර්ගයාගේ බුද්ධියට ගෞරවයකි. Perfectly යනුවෙන් අදහස් වන්නේ සර්ව සම්පූර්ණ බවයි. Enlightenment යන්නෙන් අදහස් වන්නේ Philosophy of reason and individualism යන්නයි. එසේ නම් පුද්ගලයාගේ පැවැත්මට හේතුවන යථාර්ථවාදී දර්ශනය සම්පූර්ණයෙන්ම ප්‍රත්‍යක්‍ෂ කර ගැනීමට අවශ්‍ය වූ **බුද්ධ ඥානය** තමන් වහන්සේ විසින්ම මධ්‍යම ප්‍රතිපදාව ඔස්සේ අවබෝධ කරගනිමින්, අකාලික වූ එම ශ්‍රී සද්ධර්මස්කන්දය දෙව් මිනිස් සැමට අවබෝධ කරවූ හෙයින් **"සම්මා සම්බුද්ධස්ස"** වන බව අවබෝධ කටයුතුමය.

"නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස..."

... යනුවෙන් ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර කිරීමේදී අප සජ්ඣායනා කරන්නා වූ පාලි ගාථාපාඨය, මෙලෙසින් අන්ධානුකරණයෙන් තොරවූ අර්ථානුබෝධයකින් යුතුව තෙවරක් සජ්ජායනය කරන විට හදවතින්ම අප විනිවිද දකින්නේ තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේම ය.

☸ ☸ ☸

5. තෙරුවන් සරණයාම

බුදු ගුණ පිළිබඳ මනා අවබෝධයකින් යුතුව තෙවරක් නමස්කාර කර වඩාත් පැහැදිලි ලෙස බුදුන් දුටු අපි අනතුරුව තිසරණ සරණ යන්නෙමු. ත්‍රිවිධ රත්නය වූ කලී **වජ්‍ර මාණික්‍යයකි**. මහා ජයමංගල ගාථාවන්හි (Great Verses of Joyous Victory) පෙන්නුම් කර ඇති පරිදි ලොව බොහෝ වූ වටිනා මැණික් වර්ග කොතෙක් තිබුණද **බුද්ධ, ධම්ම, සංඝ** යන උතුම් ත්‍රිවිධ රත්නයට සම කල හැකි වූ මාණික්‍යයක් නොවන්නේම ය.

යං කිංචි රතනං ලෝකෙ - විජ්ජතී විවිධාපුතු
රතනං බුද්ධ සමං නත්ථි - තස්මා සොත්ථි භවන්තුමේ

Whatever jewels may exist in the world, abundant and varied,
there is no jewel equal to Buddha - By this truth May I be secure.

යං කිංචි රතනං ලෝකෙ - විජ්ජතී විවිධාපුතු
රතනං ධම්මං සමං නත්ථි - තස්මා සොත්ථි භවන්තුමේ

Whatever jewels may exist in the world, abundant and varied,
there is no jewel equal to Dhamma - By this truth May I be secure.

යං කිංචි රතනං ලෝකෙ - විජ්ජතී විවිධාපුතු
රතනං සංඝ සමං නත්ථි - තස්මා සොත්ථි භවන්තුමේ

Whatever jewels may exist in the world, abundant and varied,
there is no jewel equal to Sangha - by this truth May I be secure.

අප තෙරුවන් සරණ යාමේදී ද, කටපාඩමින් පාලි පාඨ සජ්ඣායනය කිරීමෙන් පමණක් අර්ථ රසය හඳුනාගත නොහැක්කේමය. තමා විසින් ම ගාථා පාඨයන් කියන අවස්ථාවක දී හෝ අන් අයකු විසින් කියවීමට පොළඹවන අවස්ථාවක දී හෝ වේවා! රත්නත්‍රයේ අසීමිත වූ ගුණ බලය නුවණින් දැක අවබෝධයකින්ම සජ්ඣායනා කල හැකි නම් එතුළින්ම ලබන්නා වූ මානසික සහනය අති මහත් ය. මෙය ද තමා විසින්ම අත්දැකීමට උත්සාහ කරන්නේ නම්, එය ප්‍රායෝගික බව වැටහෙනු ඇත. ත්‍රිවිධ රත්නයේ බලයෙන් ලබන්නා වූ පිහිට ආරක්ෂාව වෙනත් කිසිම බලවේගයක් මගින් කඩා බිඳ දැමිය නොහැක්කේ, ඉහත ගාථා වලින් ධ්වනිතාර්ථ වූ පරිදි සියළුම මැණික් වර්ග කපා ඔපමට්ටම් කිරීමේ බලයක් **වජ්‍ර මාණික්‍ය** සතු වන්නාසේම ය.

අපි කවුරුත් සංසාර ගමනේ අතරමං වූවෝ වෙමු. ලැබුවා වූ එකම භාග්‍යය මනුෂ්‍යත්වයක් ලැබීමයි. බුදු රජාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූයේ ද ලැබුවා වූ මනුෂ්‍යත්වයේ උත්තරීතර ඵල නෙළා ගනිමිනි. **බුද්ධ** යන වචනයෙන් අදහස් වන්නේ අවදි වීමයි. ප්‍රබෝධාත්මකව ලැබුවා වූ පරිපූර්ණ අවදිවීමයි. තවත් අයෙකු අවදි කිරීමට අප අවදි වී සිටිය යුතුමය. එබැවින් පුද්ගලයා තනි තනිවම අවදි වීම සඳහා ඇති එකම ප්‍රවිෂ්ඨය වූ **තෙරුවන් සරණ** පතා අපි ගමන් කරන්නෙමු.

නමස්කාරයෙන් පසු අප තෙවරක් මෙලෙසින් **බුද්ධ ධම්ම සංඝ** යන ත්‍රිවිධ රත්නයේ සරණ හෙවත් පිහිට සොයා යන්නෙමු. සවණ ගැටෙන නිසා පමණින්ම නොව ත්‍රිවිධ රත්නයම නුවණින් දකිමින් අප විසින් ගාථා පාඨයන් සජ්ඣායනා කල යුතුමය.

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සංඝං සරණං ගච්ඡමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡමි
තතියම්පි සංඝං සරණං ගච්ඡමි

මෙහි සරල ඉංග්‍රීසි අර්ථය දෙසටද මෙහොතකට අවධානය යොමු කරමු.

I go to the **Buddha** for refuge
I go to the **Dhamma** for refuge
I go to the **Sanga** for refuge

For the second time;
I go to th **Buddha** for refuge
I go to the **Dhamma** for refuge
I go to the **Sanga** for refuge

For the third time;
I go to the **Buddha** for refuge
I go to the **Dhamma** for refuge
I go to the **Sanga** for refuge

මෙහි සිංහල අර්ථය දෙසටද අවධානය යොමු කරමින් වඩාත්ම පැහැදිලි මාධ්‍යතුලින් අවබෝධාත්මක දැනුමක් ලැබීමට උත්සාහ කරමු.

මම සරණ (පිහිට)පතා **බුද්ධ රත්නයට** සමීප වෙමි.
මම සරණ (පිහිට)පතා **ධර්ම රත්නයට** සමීප වෙමි.
මම සරණ (පිහිට)පතා **සංඝ රත්නයට** සමීප වෙමි.

දෙවන වරටද:
මම සරණ (පිහිට)පතා **බුද්ධ රත්නයට** සමීප වෙමි.
මම සරණ (පිහිට)පතා **ධර්ම රත්නයට** සමීප වෙමි.
මම සරණ (පිහිට)පතා **සංඝ රත්නයට** සමීප වෙමි.

තෙවන වරටද:
මම සරණ (පිහිට)පතා **බුද්ධ රත්නයට** සමීප වෙමි.
මම සරණ (පිහිට)පතා **ධර්ම රත්නයට** සමීප වෙමි.
මම සරණ (පිහිට)පතා **සංඝ රත්නයට** සමීප වෙමි.

තෙරුවන් සරණ යාම අපි පාලි පාඨයන් තුලින් අනන්ත වූ වාර ගණනාවක් ශ්‍රවණය කර ඇත්තෙමු. සජ්ඣායනය කර ඇත්තෙමු. කටපාඩමින්

කීමට මෙන්ම ලිවීමටද හැකි බව දන්නෙමු. පාලි වචනයට සීමා වූ ශබ්ද රසය ශ්‍රවණය කිරීම සහ පාලි පාඨය සජ්ඣායනය කිරීම සමගම පැහැදිලි අවබෝධයක් සඳහා **අර්ථ රසය** ද කුමන භාෂාවකින් හෝ උකහා ගැනීමට ද වීර්ය කල යුතුමය. **ධම්ම** සහ **සංඝ** යන වචන දෙක ද **බුද්ධ** යන වචනය තුළින්ම නිරූපනය වන හෙයින් මෙය **ත්‍රිවිධ රත්නය** යනුවෙන් ඒකරාශිවද හඳුන්වනු ලබයි. මෙම පාඨයන්ගෙන් ධ්වනිතාර්ථ වන අදහස හදවතට දැනුනේ නම් අර්ථය අවබෝධ කර ගෙන නුවණින් එදෙස බැලීමෙන් බුදුන් දැකීමට පුළුවන. මෙය ප්‍රායෝගිකද නැද්ද යන්න තීරණය කිරීම පාඨක ඔබටම භාර කරමි.

නමස්කාර වේවා ! බුදු රුවනට සැමදා මම **බුදු සරණ** යමි.
නමස්කාර වේවා ! දම් රුවනට සැමදා මම **දම් සරණ** යමි.
නමස්කාර වේවා ! සඟ රුවනට සැමදා මම **සඟ සරණ** යමි.
නමස්කාර වේවා ! තුණු රුවනට සැමදා **තෙරුවන් සරණ** යමි.

ඉතාම කෙටි පාලි පාඨයක වුවද යථානුරූපී අදහස නුවණින් දැකිය යුතුමය. අවබෝධ කටයුතුමය. එම අදහස් වල ඇති වටිනාකම අර්ථවත් බව මතුවී පෙනෙන්නට පෙනෙන්නට අප සිත් තුල ත්‍රිවිධ රත්නය කෙරෙහි ඇතිවන්නේ අති මහත් වූ ගෞරවයකි. එසේ නොමැතිව දොහොත් මුදුන් තබා ප්‍රකාශ කලේ කුමක්දැයි තමන්වත් නොදන්නේ නම් එය තමා විසින්ම තම බුද්ධියට අගරු කරගැනීමක්ම වන්නේය. **යථාවබෝධයකින් යුතුව තම ප්‍රඥාව මතම උපන් ගෞරවයක් ත්‍රිවිධරත්නය කෙරෙහි ඇතිවන විට එතුලින් දෘෂ්‍යමාන වන්නේ අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේමය.**

-සාධු- වචනයේ සිටම අප බුදු බණ ඇසිය යුතුයි. නුවණින් අවබෝධ කොට දැකිය යුතුයි. පරිශීලනය කල යුතුයි. මිනිසත් බව ලබා උපන් අපට අප මහ බුදුපියාණන් වහන්සේ විසින් ධර්මය නමැති එම අමිල වූ දායාදය ජාති, කුල, ගෝත්‍ර, නිලතල, බලතල, උගත්, නුගත්, ආදී කිසිදු වර්ගීකරණයකින් තොරව පවරා දී ඇත. අප විසින් කල යුත්තේ එය නිතර නිතරම පරිශීලනය කරමින් අපගේ ප්‍රඥාව දියුණු කරගැනීමයි.

6. බුද්ධාලම්භන ප්‍රීතිය

සවිස්තරාත්මකව බලන විට අප පිහිට පතා සමීප වන්නේ ඉහත සදහන් කල ශ්‍රේෂ්ඨත්වයට පත් අප අමාමෑණියන් වහන්සේ වෙතයි. උන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කර වදාල ශ්‍රී සද්ධර්මයටයි. උන් වහන්සේගේ අනුගාමික මහා සංඝ රත්නයටයි.

මෙය අවබෝධ වනවාත් සමගම පහල වන චෛතසිකය **ශ්‍රද්ධාවයි.** එතුළින් උපදින ප්‍රඥා බලයෙන් **බුද්ධ, ධම්ම, සංඝ** ත්‍රිවිධ රත්නයම නුවණින් දැක මෙසේ සරණ පතන්නෙකුට ත්‍රිවිධ රත්නයේ අනන්ත වූ ගුණ බලයෙන් ශාන්තියක්, යහපතක්ම සිදුවන අතර, හදවතට දැනෙනුයේ අති මහත් සැනසීමකි. **ශ්‍රද්ධාව, භක්තිය** හදවතේ ඇතිවිට කරුණාව මෛත්‍රිය පෙරදැරිව සිදුකරනු ලබන යහපත් ක්‍රියාවන් හමුවේ ඇතැම් අවස්ථා වලදී දැස් කදුළු වලින් තෙත් වීම පෘතග්ජන ස්වභාවයයි. **එතුලින් ඇතිවන්නේ බුදුමග ගමන් කිරීම සදහා මහත් වූ චිත්ත ශක්තියකි. අධිෂ්ඨාන පූර්වකව ලැබුවා වූ මහත් සැනසීමකී.**

මේ **සැනසීම** ඉතාමත් සියුම් වූ සිතිවිලි සමුදායකි. තම තමාගේ නැණ පමණින් තමා වෙත ළගා කරගත හැකි සුවිශේෂ නිර්මල වූ ශක්තියකි. මෙය නිරාමිස ප්‍රීතියක් යනුවෙන් හදුන්වා දිය හැක. එය බාහිර අයෙකුට හෝ කිසිම බලවේගයකට කඩා විසුරුවා හැරීමට නොහැක්කේමය. මේ සැනසීම තුලින්ම අප හදවත් තුල **ශ්‍රද්ධාව** සමගින්ම **ප්‍රඥාව** වර්ධනය වනු ඇත. සත්‍ය තේරුම් ගැනීමේ හැකියාව වර්ධනය වනු ඇත. අයෙක් ධර්මය යථාර්ථවාදීව

දකී නම් ඔහු බුදුන් දැක්කේ වෙයි. එලෙස "**බුද්ධ**"යන වචනයේ ශ්‍රේෂ්ඨත්වය අරමුණු කර ගත්විට හදවත් **බුද්ධාලම්භන ප්‍රීතියෙන්** ඔද වැඩී යයි.

එවන් ප්‍රීතියකින් ප්‍රභාෂ්වර වූ මනසක් මත ශ්‍රී සද්ධර්මයේ අසම සම වූ දීප්තිමත් කිරණ ශක්තිමත් ලෙසින් ඒකරේඛීයව පතිත වීම නිසා ත්‍රිවිධ රත්නයේ පිහිට ආරක්‍ෂාව ඉතා ප්‍රබල ලෙසින් ඔහු කෙරේ බල පවත්වනු ඇත. යමෙක් විසින් නපුරක් කලද, ත්‍රිවිධ රත්නයේ දෘඪ ආරක්‍ෂාව ලබා ඇති අයෙකු කරා එය ළගා වන විට සියළු බල නොසිතූ අයුරින් බිඳී යාම පමණක් නොව බලාපොරොත්තු නොවූ යහපතක් කරා එය පරිවර්තනය වනු ඇත.

7. පංචශීලය

ත්‍රිවිධ රත්නයේ අනන්ත වූ ගුණ බලය හදවතින් වැළඳගත් අපි මී ළඟට සූදානම් වන්නේ පන්සිල් ගැනීමටයි.

පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
කාමේසුමිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි
මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි
සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි

මෙය **පන්සිල් ගැනීම** යනුවෙන් ව්‍යවහාරයේ පැවතුන ද ඉන් අදහස් වන්නේ කුමක්දැ යි විචාර බුද්ධියෙන්ම සිහිකලයුතුය. මදක් ගැඹුරෙන් බලන්නෙකුට එය ශික්ෂා පද පහක් සමාදන් වීමක් ලෙසින් දැකිය හැක. එහෙත් පන්සිල් හෙවත් මෙම පංචශීලය රැකීමට ශ්‍රද්ධා සම්පන්නව අපි තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ අභියස අනතුරුව සූදානම් වන්නේ බුදුරජාණන් වහන්සේගේ ධර්මය අනුව බෞද්ධ ජනතාව විසින් නිරතුරුවම පිළිපැදිය යුතු වූ ශික්ෂාපද 5 **පිළිපැදීමට ප්‍රතිඥා දීමටයි.**

අපි උපන් දා සිට මේ දක්වා ලක්ෂ සංඛ්‍යාත වාර ගණනක් මෙම ශික්ෂා පද 5 ශ්‍රවණය කර ඇත්තෙමු. සජ්ඣායනා කර ඇත්තෙමු. එහෙත් මෙම සිල් පද පහේ අර්ථය ඔබේ හදවතට දැනුනේද? වචනයක් වචනයක් පාසා තිබෙන්නාවූ අර්ථය හදවතට දැනෙන විට අප මේ ප්‍රතිඥා දෙන්නේ

තුමක් සදහාද යන්න වඩාත් පැහැදිලි වනු ඇත. ශ්‍රද්ධා සම්පන්නව ප්‍රතිපත්තීන් 5 ක් රැකීමට ප්‍රතිඥා දෙන අප විසින් මෙම අදියරේදී, සිත්හි ධාරණය කරගත් ශික්ෂාවන් අනුව එය ආරක්ෂා කර ගැනීමට යහපත් වූ මානසික සෞඛ්‍යයකින් යුතුව හැකි පමණින් **වීර්ය** කල යුතුව තිබේ. අප ලැබුවා වූ මෙම මිනිස් ජීවිතය තුලදීම **ධර්මාවබෝධය** තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් ප්‍රගුණ කර ගත හැකියි. නමුත් කුමන දෙයක වුවත් සාර්ථක ප්‍රතිපල ලැබීමට නම් අවබෝධයකින් සහ කැප වීමකින් යුතුව එයට අවතීර්ණ වීම අත්‍යාවශ්‍යම දෙයකි. ඒ සදහා පාලි භාෂාවෙන් සජ්ඣායනය කල ශික්ෂා පද පිළිබදව වෙනත් භාෂාවක් තුලින් හෝ අර්ථාන්විත අවබෝධයක් ලැබිය යුතුමය.

I undertake the training rule - to abstain from taking (slaying) lives
I undertake the training rule - to abstain from stealing
I undertake the training rule - to abstain from sexual misconduct
I undertake the training rule - to abstain from telling lies
I undertake the training rule - to abstain from intoxicating drinks, drugs which cause headlessness

අපගේ ප්‍රතිඥාව කුමක්ද? අපගේ යහපත් පැවැත්ම සදහා මෙලොවදීම ඉවහල් වන මෙලොව පරලොව දෙකේහිදීම නිසි එල ලබාදෙන්නා වූ පද පහකින් සමන්විත වූ කිසියම් ව්‍රතයක්, න්‍යාය ධර්මයක් ආරක්ෂා කිරීම සදහා හෘදය සාක්ෂිය හමුවේ දෙනු ලබන ප්‍රතිඥාවකි.

1. සතුන් මැරීමෙන් වැලකීම නම් වූ ශික්ෂාපදය මම සමාදන් වෙමි.
   එනම් සත්ව ජීවිතයක් නැතිකිරීමෙන් වැලකීම, පුහුණු කරවීම සදහා වූ බෞද්ධ අධ්‍යයන න්‍යාය පිළිපැදීමට මා එකග වන බවයි.

2. සොරකම් කිරීමෙන් වැළකීම නම් වූ ශික්ෂාපදය මම සමාදන් වෙමි.
   එනම් සොරකම් කිරීමෙන් වැළකීම, පුහුණු කරවීම සදහා වූ බෞද්ධ අධ්‍යයන න්‍යාය පිළිපැදීමට මා එකග වන බවයි.

3. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැලකීමේ ශික්ෂාපදය මම සමාදන් වෙමි.
   එනම් ලිංගික අනිසි ක්‍රියාකාරකම් වලින් වැළකීම, පුහුණු කරවීම සදහා වූ බෞද්ධ අධ්‍යයන න්‍යාය පිළිපැදීමට මා එකග වන බවයි.

4. බොරු කීමෙන් වැලකීම නම් වූ ශික්ෂාපදය මම සමාදන් වෙමි.
   එනම් අසත්‍ය දේ ප්‍රකාශ කිරීමෙන් වැළකීම, පුහුණු කරවීම සදහා වූ බෞද්ධ අධ්‍යයන න්‍යාය පිළිපැදීමට මා එකග වන බවයි.

5. මත් වතුර පානයෙන් සහ මත් ද්‍රව්‍ය භාවිතයෙන් වැලකීම නම් වූ ශික්ෂාපදය මම සමාදන් වෙමි.
එනම් මත්වතුර සහ මත් ද්‍රව්‍ය ශරීරගත කර ගැනීමෙන් වැළකීම, පුහුණු කරවීම සදහා වූ බෞද්ධ අධ්‍යයන න්‍යාය පිළිපැදීමට මා එකඟ වන බවයි.

මෙම එකග වීම සමාදන් වීම හෙවත් ආරක්‍ෂා කිරීම ඉංග්‍රීසි භාෂාවේ එන observe නමැති වචනයෙන් පැහැදිලි කිරීම වඩාත් උචිත යැයි සිතමි. Oxford ශබ්ද කෝෂයට අනුව මෙය perceive/ become aware of වැනි අර්ථ ගෙන දෙයි. "perceive" යනු බැලීමයි. හඳුනාගැනීමයි. ඒ අනුව මෙම ශික්ෂාපද පහ තුලින් ප්‍රකාශ වුයේ කුමක් දැයි අප පළමුවෙන් බැලිය යුතුයි. ඒ බැලීම සහ දැකීම පියවි ඇසින් නොවන අතර ප්‍රඥාව තුළින්ම විය යුතුය (become aware of) යන්නෙහි අර්ථය ඒ පිළිබඳව දැනුවත් වීමයි. **එසේ නම් ශික්‍ෂා පදයන්හි අර්ථය දෙස සිහි නුවණින් බලා, හඳුනාගෙන විමසිලිමත්ව කරුණු අවධානයට ගෙන එයට අනුකුලව තම චර්යාවන් පවත්වාගැනීම සමාදන් වීම යනුවෙන් අර්ථ විග්‍රහ කල හැක.**

මෙලෙස නිවැරදි දැක්මකින්, යහපත් වූ සිහි නුවණින් යුතුව පංචශීලයෙහි පිහිටීමේදී උන් වහන්සේ ගේ ශ්‍රී මුඛයෙන් දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය ප්‍රතිපත්තිගරුකව රැකීමට අප එකඟ වූ බවත්, අප විසින් දැඩි ආත්මශක්තියකින් සහ වීර්යයකින් යුතුව එය රකිනා බවත් හදවතට දැනෙන විට ඇතිවන්නේ අසීමිත ශ්‍රද්ධාවකි. ශ්‍රද්ධා සම්පන්න හදවතක පෝෂණය වන ප්‍රඥාව තුලින් අනතුරුව දෘශ්‍යමාන වනුයේ අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේමය.

මනුෂ්‍යත්වය ලැබු අප සැම දෙනාම උත්පත්තියෙන්ම ලද, වටිනා කම තක්සේරු කල නොහැකි දායාදයක් අප සතුව ඇත. එය වූ කලී පෙර පින් බලයෙන් ඉතා අපහසුවෙන් අප ලබාගන්තා වූ මනුෂ්‍යත්වයේ නාමයෙන්, සකල ලෝ වැස්සන්ගේ යහපත පිණිසම ලොව පහල වූ තිලෝගුරු බුදු පියාණන් විසින් අප වෙත විවෘතකර තැබුවා වු විමුක්ති මාර්ගයයි. ඒ ඔස්සේ පියවර මැනීම සහ නිසි ඵල නොලා ගැනීම අප එකිනෙකා සතු පෞද්ගලික කාර්යයන් වනු ඇත. අයෙකු එම මාවත ඔස්සේ යම් දුරක් ගමන් කර ලබාගන්නා වූ ඵලය වෙනත් අයෙකු විසින් සොරාගැනීමට, භුක්තිවිඳීමට හෝ ද්වේශ කරමින් විනාශ කිරීමට හෝ නොහැක්කේමය. අප විසින් කල යුත්තේ තනි තනිවම වීර්ය කර නිසි ඵල නෙලා ගැනීමයි.

8. බුදුන් වැදීම

බුදු රජාණන් වහන්සේගේ අපරිමිත වූ ගුණ සමුදාය සිහි නුවණින් යුතුව මෙනෙහි කිරීමට අපි දැන් සූදානම් වන්නෙමු. මෙහි ඇති බලය අති විශාලය. නූතන ලෝකයේ දියුණු තාක්ෂණයෙන් වුවද දුරස්ථ පාලකයක් මගින් බලයක් ලබාදිය හැක්කේ සීමිත දුරකට පමණි. එහෙත් අසීමිත දුරක සිට වුවද අනභිබවනීය බලයක් ලබා ගත හැකි වූ මහා බල සම්පන්න **බුදුගුණ** අවබෝධයකින් යුතුව සිහි කරන්නේ නම් එයින් ලැබෙන්නා වු ශක්තිය අභ්‍යවකාශගත කරන රොකට් යානයකට සපයනු ලබන ආරම්භක ශක්තියට වඩා බලවත් වනු ඇත. අභ්‍යවකාශයානයක්, ලබාදෙන්නා වූ ශක්තිය මත, නිර්ණය කරනු ලැබූ ගමන් මාර්ගය ඔස්සේ කිසියම් ග්‍රහලෝකයක් මත පතිත වුවද, ඉන්ධන බලශක්ති ක්ෂය වීමෙන් දින ගණාන ඉක්ම වෙනවාත් සමගම එය නැවත පෘථිවි ගතවනු ඇත.

බුදුගුණ බලයෙන් ආරම්භක ශක්තිය ලබා නිර්වාණ මාර්ගය ඔස්සේ අතිශය රමණීය වූ නිර්වාණ සුවය ඉලක්ක කරගෙන යානයට ගොඩ නැගෙන්නෙකු ලබන්නා වූ ආරම්භක ශක්තිය අති ප්‍රබල හෙයින් නැවත ආපසු ගමන් කිරීමක් සිදු නොවනු ඇත.

බුදුගුණ, අර්ථය මෙනෙහි කරමින් සිහි කරන්නේ නම් එය ලොව පවත්නා ඉතාම බලගතු මන්ත්‍රය බව බුද්ධිමතෙකුට වටහා ගැනීම අසීරු නොවන්නේමය.එම නව **අරහාදී බුදුගුණ** තුල ගැබ්ව ඇති සත්‍යයේ බලයෙන් ජයගත නොහැකි කිසිදු බලවේගයක් නැත. එහෙත් අවශ්‍යවන්නේ කුමක්ද ? සත්‍යය සත්‍ය ලෙසින් දැකීමට අපගේ ප්‍රඥාව දියුණු කර ගැනීමයි.

සත්‍යය සත්‍ය ලෙසින්ම දැකීමෙන් අනතුරුව එය සත්‍ය ලෙසින්ම ලිඛිතව හෝ වාචිකව ඉදිරිපත් කිරීමට ඇති ශක්තිය අනභිභවනීය වනු ඇත. වසර 2550ක් ඉක්ම ගොස් ඇතත්, අසමසම ගුරු දේවයාණන් වූ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර වදාළ සියළුම ධර්මතාවයන් නූතන විද්‍යාඥයන් විසින් සොයාගනු ලැබූ සියළුම සිද්ධාන්තයන් අභිභවා අදත් පෙරමුණේ සිටින්නේ **ධර්මයේ සත්‍යතාවය** මුළු මහත් සක්වලටම විදහාපාමිනි.

අප භාග්‍යවතුන් වහන්සේ ජීවමානව සිටියදී, වනගත ආරණ්‍යයන්හි හෝ වෘක්ෂ මූලයන්හි බවුන් වඩන භික්ෂූන් වහන්සේලාට ඇති විය හැකි බිය, උපද්‍රයවන්ගෙන් ගැලවීම සඳහා ඔවුනට දුන් උපදෙස් එදා වැඩ විසූ භික්ෂූන් වහන්සේලාට පමණක් නොව අද සංසාර ගමනේ අතරමංව සිටින්නාවූ අපටද අති මහත් වූ ශක්තියකි.ලෙඩ රෝග වලින්, නපුරු සතුන්ගෙන්, ගුප්ත බලවේගයකින් හෝ රාජ්‍ය බලපෑමකින් හෝ කිසියම් කෙනෙකුට අසමතුලිත වූ චෛතසිකයක් උපන් විටකදී නව අරහාදී බුදුගුණ සමුදායේ සත්‍යතාවය නිසි අවබෝධයකින් යුතුව සිහි කිරීමෙන්, එම තත්වය පහව ගොස් සැනසීමක් ලැබිය හැක්කේමය.

එසේනම් මෙම අති ශ්‍රේෂ්ඨ වූ නවඅරහාදී බුදුගුණ දෙස අපි විමසිලිමත්ව බලමු.

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේව මනුස්සානං බුද්ධෝ භගවාතී

Such, inded, is the Ealted One: the worthy One, perfectly enlightened, endowed with clear vision and virtuous conduct, the knower of the world, the incomparable leader of men to be tamed, the teacher of gods & men, enlightened & sacred.

අප උපන්දා සිට මෙම ගාථා පාඨය පාලි බසින් කී වාරයක් සජ්ඣායනා කර ඇත්ද? කී වාරයක් සවන් ගැටී ඇත්ද? කී වාරයක් නෙතට ගෝචර වී ඇත්ද? එහෙත් මෙහි අර්ථ රසය උකහා ගත්තේද?

නව අරහාදී බුදු ගුණයන්ගෙන් යුත්, පාලි වචන දහ අටකින් සමන්විත මෙම මහානුභාව සම්පන්න ගාථා පාඨයෙහි සැබෑ අරුත විග්‍රහ කිරීමට භාෂා කීපයකින් වචන කෝටි ගණනක් යොදා ගත් තේ වුවද, එය ප්‍රමාණවත් නොවනු ඇත. අනන්ත වූ බුදුගුණ සමුදායක් සංක්ෂිප්තව එළි දක්වා ඇති මෙම ගාථා පාඨය පිළිබඳව පළමු අදියරේදීම සැකෙවින් හෝ දැනුවත් වීමට අප උත්සාහ කළ යුතුයි.

මෙහි එන පළමු බුදුගුණය වූ **අරහං** යන පදයට ඉංග්‍රීසි බසින් (Worthy, having sufficient worth of honour) යනුවෙන් අර්ථ විග්‍රහයක් දිය හැකි නමුත් මෙම වටිනා බව හෙවත් සුදුසු බව අප විසින් මනා සේ අවබෝධ කටයුතුමය.

තුන් ලෝකාග්‍ර වූ බුදුරජාණන් වහන්සේ සකල ක්ලේශයන් ප්‍රහීන කළ හෙයින්, ශ්‍රද්ධා සිතැතිව කවරෙකු විසින් හෝ පුදනු ලබන පූජාවන් ලැබීමට වඩාත්ම සුදුසු වූ සේක. එම උතුම් **අරහං ගුණය** අප පළමු කොටම මෙහිදී පසක් කර ගත යුතුය. (4වන පරිච්ඡේදයේ මෙම අරහං ගුණය සවිස්තරව දක්වා ඇත.)

බුද්ධ වන්දනාවේදී දෙවනුව ප්‍රකාශ වන **සම්මා සම්බුද්ධ ගුණය**, (Perfectly Enlightened) යනුවෙන් ඉංග්‍රීසි බසින් අරුත් දිය හැකි නමුත්, එයද වඩාත් පැහැදිලි ලෙසින් අවබෝධ කටයුතුය. මෙයින් අදහස් වනුයේ තමා විසින්ම එනම් අන් කවරෙකුගේ හෝ ගුරු හරු කම්, මග පෙන්වීම් හෝ උපකාරයන් නොමැතිව ස්වෝත්සාහයෙන්, තුන්කල්හිම ලොව බලපවත්නා සියළුම ධර්මතාවයන් නිසි ලෙසින්, ඇති සැටියෙන් අවබෝධ කර ගැනීම සහ තමන් වහන්සේ අවබෝධ කරගත්තා වූ එම ධර්මය සකළ ලෝ වැස්සන්ගේ යහපත පිණිස දෙවි, මිනිස් සැමට අවබෝධ කරවීමයි. එවන් සුවිශේෂ වූ ශක්තියක් තථාගත බුදුරජාණන් වහන්සේ සතු වූ හෙයින් එම "**සම්මා සම්බුද්ධ ගුණය**" ගාථා පාඨය සජ්ඣායනා කිරීමේදී අප හදවතට දැනෙන්නේ නම් ඒ තුලින් ජීවමාන බුදුන් වහන්සේ අපට දෘශ්‍යමාන නොවන්නේද?

මීළගට එන **විජ්ජාචරණ සම්පන්න** ගුණය පිළිබඳව ද අප දැනුවත් වීමට උත්සාහ කරමු. (Endowed with knowledge & conduct) යන්නෙන් දැනුම ලබා ගැනීම, කරුණු අවබෝධ කර ගැනීම සහ ඒ අනුව පැවතීම යනුවෙන් සරල අදහසක් ලබාගත හැකි නමුත්, මෙම ගුණය නිසි ලෙසින් හදුන්වා දීමට ශබ්ද කෝෂයේ වචන ප්‍රමාණවත් වේද යන්න සාධාරණ සැකයකි. ජීවිත පැවැත්මට ඉවහල් වන ඒ ඒ ධර්මතාවයන් පිළිබඳව ප්‍රඥාගෝචරව ලබන්නා වූ දැනුම විද්‍යාව යනුවෙන්ද, ඒ සදහා පාදක වන සීලය සහ සමාධිය "**චරණ**" යනුවෙන්ද කෙටියෙන් අර්ථ විග්‍රහ කල හැකියි. විචාර බුද්ධියකින් යුතුව මෙම ගුණය පිළිබඳව කල්පනා කරන විට එය ඉතා සුක්ෂම වූත් අති ශ්‍රේෂ්ඨ වූත් දැනුම් සම්භාරයක් බව අවබෝධ කටයුතුමය.

අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සීල සමාධි පදනම් කොට විදර්ශනා ඥානය ලැබීමෙන් අනතුරුව එම ඥාණ ශක්තිය අඛ්‍යයරෙන් අඛ්‍යයර වඩ වඩාත් පුළුල් කරගනිමින් ප්‍රාතිහාර්ය පෑමටත්, පටාචාරා, කිසාගෝතමී වැනි හදවත් ගිනිගෙන සිටි අයගේ සිත් දැකීමටත්, පෙර ආත්ම සිහි කිරීමටත්, ඉතා සියුම් රූප දැකීමටත්, අවසානයේදී සියළුම කෙලෙස් සහමුලින්ම නැති කර දැමීමට අවශ්‍ය වූ **සම්බුද්ධ ඥාන ශක්තිය** ලැබීමටත්, භාග්‍ය සම්පන්න වූ බව

බුදුන් වැදීමේදී අපට සිහිපත් කර ගත හැකි නම් ඒ ප්‍රභාශ්වර වූ මනැසින් අපට බුදුරජාණන් වහන්සේ දැකිය හැකිය.

මීළගට එන **සුගත** නම් වූ ගුණය පිළිබඳව ද අපි හැකි පමණින් දැනුවත් වෙමු. ශරීරයට අධික ලෙස සැපදීමට වුවද ප්‍රමාණවත් වාතාවරණයක සිටි සිදුහත් තවුසාණෝ, එයින් වැළකී ශරීරයට අධික දුක දීමෙන් හෝ බුද්ධ ඥානය ලබාගැනීමට අදහස් කල ද තම අරමුණ සාක්ෂාත් කර ගැනීමට එය බාධාවක් බව නුවණින් කල්පනා කර විකල්ප මාර්ගයකට පිළිපන්හ. එදා පටන් උන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරමින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඔස්සේ ඒ සුන්දර වූ සුවිශේෂී නිවන් මග සොයාගත් බැවින් එම ශ්‍රේෂ්ඨ ගුණය **"සුගත"** නමින් ගාථා පාඨයෙන් එළි දක්වා ඇති බව අප විසින් අවබෝධ කටයුතුමය.

තුන් ලෝකයම විද්‍යාමාන වූ බුදුරජාණන් වහන්සේගේ **ලෝක විදූ ගුණය** අපි අනතුරුව මෙනෙහි කරන්නෙමු. මෙම ගුණාංගය (Well-gone knower of the world) යනුවෙන් ඉතා ලුහුඬින් ඉංග්‍රීසි බසින් හුවා දැක්විය හැකි නමුත් එයද වචන වලින් ඔබ්බට අවබෝධ කටයුතුමය. දිව්‍යලෝක 6 සහ මනුෂ්‍ය ලෝකය හැරුණ විට රූපාවචර අරූපාවචර භූමි සමඟින් භූමි වශයෙන් සලකා බලන කල භූමි 31 කින් සමන්විත මුළු සක්වලෙහිම සත්වයින්ගේ පැවැත්ම පිළිබඳව යථාර්ථවාදීව කරුණු සියල්ලම මැනවින් අවබෝධ කරගත් උන්වහන්සේගේ එම විනිවිද දක්නා නුවණ **"ලෝක විදූ ගුණය"** යනුවෙන් ඉතා සංක්ෂිප්තව ගාථා පාඨයේ පස් වන බුදු ගුණය හැටියට හුවා දක්වා ඇත.

අනුත්තර පුරිස දම්ම සාරථී ගුණය වූ කලී උන්වහන්සේ සතුව තිබූ අද්විතීය ශක්ති ධාරාවකි. (Supreme trainer of persons to be tamed) යනුවෙන් පාලි පාඨය සරලව ඉංග්‍රීසි බසින් අර්ථවත් වන නමුත් එය, දමනය කර ගැනීමට අසීරු වූ ඕනෑම මනුෂ්‍යයෙකු ධර්ම මාර්ගයට යොමු කරවා දමනය කිරීමේ සුවිශේෂ වූ ක්‍රම වේදයක් ලෙසින් දැකිය හැකියි. බෞද්ධ ඉතිහාසයේ සඳහන් වී ඇති අංගුලිමාල, ආලවක වැනි කථා පුවත් මගින් මෙය ඉතා පැහැදිලි ලෙස අවබෝධ වනු ඇත.

හත්වන බුදුගුණය හැටියට මීළඟට හුවා දක්වා ඇත්තේ **සත්ථා දේව මනුස්සානං** බුදුගුණයයි. (Teacher of Gods & Men) යනුවෙන් ඉංග්‍රීසි බසින් සරලව අර්ථය පැහැදිලි කල හැකියි. එහෙත් එපමණකින් නොනැවතී උන්වහන්සේගේ ශාස්තෘත්වය විමසිලිමත්ව බුද්ධියට ගෝචර කරගත යුතුයි. අප මහ බුදුරජාණන් වහන්සේ සදෙව් ලෝකයන් හි වසන සියළුම දෙවිවරුන්ගේත් මනුෂ්‍ය ලෝකයේ සැරිසරන සියළුම මනුෂ්‍යයින්ගේත් සනාතන ශාස්තෘ වරයාණන් වූ සේක. යහපත් ලෞකික ජීවිත ගත කිරීමට අවශ්‍ය මාර්ග පහදා දුන් උන් වහන්සේ පරලොව සුගතිගාමී කර ගැනීමට අවශ්‍ය උපදෙස් මෙන්ම සියළු දුක් නැති කර ගැනීම

සඳහා වූ නිවන් මග සැමට පහදා දුන් බව අප සිහිපත් කල යුතුමය. ධර්මාවබෝධයෙන් උන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය මෙසේ දකින කල එය ජීවමාන බුදුරජාණන් වහන්සේ දක්නේම වෙයි.

නව අරහාදී බුදුගුණ මෙනෙහි කරන අපගේ අවධානය මීළඟට **බුද්ධ** යන අති පාරිශුද්ධ වූ ශ්‍රේෂ්ඨ වදන කෙරෙහි යොමු වනු ඇත. ඉංග්‍රීසි බසින් (Enlightenment) යනුවෙන් හඳුන්වනු ලබන මෙම ශ්‍රේෂ්ඨත්වය (Oxford Dictionary) හි අර්ථ විග්‍රහයට අනුව (Philosophy of reason & indivdualism) යනුවෙන් පැහැදිලි වන අතර එම දර්ශනය සියළුම මිත්‍යා මත වලින් තොරවූ ගැඹුරු අවබෝධයක් මෙන්ම ඉතාමත් නිර්මල වූ පූජනීයත්වයට පත් වූ මනාව පසක් කරගත්තාවූ හේතු - ඵල ධර්මතාවයන් මත පදනම් වූ යථාවබෝධයක්ම වන්නේය. තුන් ලෝකයේම යථාර්ථය මෙලෙසින් දැක චතුරාර්ය සත්‍ය තමා විසින්ම අවබෝධ කරගනිමින් සර්වඥතාඥානය ලබාගත් හෙයින් "**බුද්ධ**" යනුවෙන් හඳුන්වනු ලබයි. **එම නිර්මල වූ ශ්‍රේෂ්ඨ ගුණාංගය අර්ථාවබෝධයකින් යුතුව ප්‍රඥාගෝචරව අප විසින් දක්නා කල්හි එම දර්ශනය ඔස්සේ අපට දෘශ්‍යමානවන්නේ ජීවමානව වැඩ සිටින තථාගත සම්මා සම්බුදු රජාණන් වහ්නසේම ය.**

මීළඟ බුදුගුණය වූ **භගවා ගුණය** අප තථාගත අමා මෑණියන් වූ බුදුරජාණන් වහන්සේගේ භාග්‍යවන්ත භාවය මනාව පිළිඹිබු කරයි. (Exalted/ Glorious) වැනි ඉංග්‍රීසි භාෂාවේ එන වචන මගින් කළ හැක්කේ මෙම භාග්‍යය සංකේතවත් කිරීමක් පමණි.

මෙහි යථාර්ථය ඒ සෑම වචනයක්ම අභිභවා යන සුවිශේෂවත් වූ භාග්‍යයකි. උන් වහන්සේට උපතින්ම උරුමව තිබූ රූප ශෝභාව, පිරිවර, කීර්තිය, යස ඉසුරු සියල්ල අභිභවා ත්‍යාගවන්ත බව, නිර්භීතකම, නුවණ, ශක්තිය, ඉවසීම, සත්‍යගරුකබව, අධිෂ්ඨානශීලීතාවය, කාරුණිකත්වය, සමතුලිත මානසිකත්වය මෙන්ම ගිහි ගෙය නික්මයාම වැනි අධිෂ්ඨානපූර්වකව තීරණ ගැනීමටත්, පිරුවා වූ පාරමී දම් බලෙන් බුද්ධත්වයට පත්වීමටත්, සකල ලෝක වාසී සැමට යහපත සැලැස්වීමටත්, විශ්වයේ පවත්නා ඕනෑම දෙයක් අභිමතය පරිදි මෙහෙයවීමටත්, සියළු සතුන් දුකින් මුදවාලීමටත්, උන්වහන්සේ සතුව තිබූ **අද්විතීය සෞභාග්‍ය සම්පත්තිය** කුමන භාෂාවකින් හෝ වචනයෙන් විස්තර කල නොහැක්කේමය.

"භගවා ගුණය" තුලින් නිරූපනය වන මෙම ශ්‍රේෂ්ඨත්වය පියවි ඇසින් වචන තුලින් දැකීම උගහට වුවත් මෙම සුවිශේෂවත් වූ භාග්‍යය හදවතින් දක්නා විට ප්‍රඥාව නැමැති ආලෝක කිරණ ඔස්සේ අපට දිස්වන්නේ සම්මා සම්බුදුරජාණන් වහන්සේමය.

☸ ☸ ☸

9. ධර්ම රත්නය වැඳීම.

නව අරහාදී බුදුගුණ අර්ථාන්විතව සිහිපත් කරමින් බුදුන් දුටු අපි අනතුරුව ධර්ම රත්නයට සමීප වන්නෙමු.

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ ඒහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති.

(Dhamma of the exalted one, is perfectrly expounded from the beginning to the end. It exists & can be seen; not limited for a certain period, Inviting one to come & see - leading onwards to Nibbana-to be individually realized by the wise.)

අප මහ බුදු රජාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පෙරුම් දම් පුරා ස්වෝත්සාහයෙන් අවබෝධ කරගත් ශ්‍රී සද්ධර්මස්කන්දය සියළු දෙව් මිනිසුන් කෙරෙහි පතල වූ මහා කරුණා ගුණයෙන් යුතුව දේශනා කර වදාළ සේක. සකල ලෝකවාසීන් කෙරෙහි අනුකම්පා කොට වදාළ එම අති පාරිශුද්ධ වූත්, බලයෙන් රසයෙන් ගුණයෙන් අනූන වූත්, අමිල **ධර්ම රත්නය** අප විසින් අවබෝධයකින් යුතුවම නමස්කාර කටයුතුමය.

ශ්‍රී සද්ධර්මයේ **ස්වාක්ඛාත** නම් වූ ගුණය අපි පළමුවෙන්ම උච්චාරණය කරන්නෙමු. (Prefectly expounded from the beginning to the end..) යනුවෙන් ඉංග්‍රීසි බසින් සාමාන්‍ය අවබෝධයක් ලබාගත හැකියි. එහෙත් අති විශාල වූත් ගැඹුරු වූත් ධර්මස්කන්දයක් පහසුවෙන් අවබෝධ කරගත හැකි වන සේ සවිස්තරාත්මකව ආරම්භයේ සිට අවසානය දක්වාම ඉතාමත් ක්‍රමානුකූලව, කිසිදු කොටසක් මගහැරී යාමට ඉඩ නොතබා සම්පූර්ණයෙන්ම මනා සේ සකස්කර, ඒ භගවත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ හෙයින්

ස්වාක්ඛාත වන අතර **ධර්ම රත්නය** වන්දනා කිරීමේ දී **ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ** යනුවෙන් එම සත්‍යය පළමුවෙන්ම අප විසින් සිහිපත් කෙරෙනු ඇත.

අනතුරුව ධර්ම රත්නයේ ඇති **සන්දිට්ඨික ගුණය** අවබෝධ කටයුතුමය. මේය ඉංග්‍රීසි බසින් (exist & can be seen) යනුවෙන් සරලව අර්ථ දක්වා ඇතත් ඒ පිළිබඳව ද ඉන් ඔබ්බට සිතා බලන විට එයින් අදහස් වන්නේ, ලොවෙහි සජීවී ලෙස පවත්නා මෙම අනවරත ධර්මය අනුගමනය කරන්නෙකුට නැතහොත් මෙම ධර්ම මාවතට පිවිසෙන්නෙකුට ඒ මොහොතේ සිටම එහි ප්‍රතිපල දැකියහැකි බවයි. අප නිරවුල් මනසක් සහ නිදහස් සිතුවිලි පාදක කරගනිමින් මෙම මාවතේ ගමන් කරන විට අප කරා එන යහපත් ප්‍රතිපල මගින්, ඒ උතුම් ධර්ම රත්නයේ **සන්දිට්ඨික ගුණය** අපටම ප්‍රත්‍යක්ෂ වනු ඇත.

ශ්‍රී සද්ධර්මය තුල ගැබ්ව ඇති **අකාලික ගුණයෙන්** පිළිඹිබු වන්නේ එය කිසියම් කාල පරාසයකට සීමා වූවක් නොවන බවයි. (not limited for a certain period) කාලය නමැති මිනුම් දණ්ඩට හසුනොවන සුවිශේෂත්වයක් ඇති මෙම ශ්‍රී සද්ධර්මය මුළු විශ්වය පුරාම කිසිම වෙනසකට විකෘතියකට භාජනය නොවී එකම ආකාරයකට සදාතනික ලෙස පවතී. මෙම ධර්ම මාර්ගයට අවතීර්ණ වන්නෙකුට ආපසු නොහැරී නිර්වාණය දක්වාම ගමන් කිරීමට අවශ්‍ය වාතාවරණය සැකසෙන්නේ අප කුමන ලෝක වල උත්පත්තිය ලැබුව ද මෙම ශ්‍රී සද්ධර්මය එක ලෙසින් විශ්වය පුරාම අකාලික ගුණයෙන් යුතුව පවත්නා බැවිනි.

ඕනෑම අයෙකුගේ දෛනික ප්‍රායෝගික ජීවිත වලට ගෝචර කරගත හැකි අවස්ථාවක් **ඒහිපස්සික ගුණාංගය** තුලින් ලබාදෙයි. (inviting one to come & see) යනුවෙන් සරල ඉංග්‍රීසි බසින් අරුත් දෙන මෙම ගුණාංගයෙන් අදහස් වන්නේ ඕනෑම කෙනෙකුට මෙම ධර්ම මාර්ගයට අවතීර්ණ වී ප්‍රතිඵල නිරීක්ෂණය කළ හැකි බවයි. ධර්මය තුල පිළිගත හැකි යථාර්ථවාදී සත්‍යය ගොනු වී ඇති හෙයින් මෙම අභියෝගය සෘජුව එල්ල කිරීමට තරම් ශ්‍රී සද්ධර්මය ශක්තිමත් ව ඇති බවට අප දැනුවත් විය යුතුයි. **ඕනෑම මතධාරී අයෙකුට අත් දැකීම සඳහා නිරාවරණය කර ඇති මෙම ධර්මය ස්වයං නිරීක්ෂණය සඳහා විවෘතව ආරාධනා කිරීමට තරම් යථාර්ථ පෝෂණයක් ලබා ඇති බව අප විසින් අවබෝධ කටයුතුමය.**

ඕපනයික ගුණයෙන්, **අවබෝධ කරගත් ධර්මය** සිත් තුල රඳවා තබා ගත හැකි බව සහ ඒ ඔස්සේ ඉදිරියට යා හැකි බව පෙන්නුම් කරයි. (leading onwards) යනුවෙන් ඉංග්‍රීසි බසින් මෙය අර්ථ දක්වා ඇත්තේ එසේ ඉදිරියට යාමට මඟ පෙන්විය හැකි බලයක් ධර්මය තුළම ගැබ්ව ඇති හෙයිනි.

ඉහතකී ගුණයන්ගෙන් සමන්විත ශ්‍රී සද්ධර්මය ප්‍රඥාවන්තයින් සඳහා දේශනා කොට වදාල ධර්මයක් හෙයින්, මෙම දහම් වැඳීමේ ගාථා පාඨය අවසන් වන්නේ - පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති යනුවෙනි. ඉංග්‍රීසි බසින් (to be

personally realized by the wise) යනුවෙන් අර්ථය ගෙන හැර පා ඇත්තේ ධර්මය අවබෝධ කර ගැනීමේ සහ එහි සාරය උකහා ගැනීමේ ප්‍රවණතාවය එක් එක් පුද්ගලයාගේ ප්‍රඥාව මතම රඳා පවතින බැවිනි.

10. සංඝ රත්නය වැඳීම

යථාවබෝධයකින් යුතුව ධර්මය දකිමින් වන්දනා කිරීමෙන් අනතුරුව අපි දෛනිකව නිරතුරුවම සංඝ රත්නය දෙසට ප්‍රවිශ්ඨ වෙමින් ගාථා පාඨය, කට පාඩමින් සජ්ඣායනා කරන්නෙමු.

සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ, උජුපටිපන්නෝ භගවතො සාවක සංඝො, ඤායපටිපන්නෝ භගවතො සාවක සංඝො, සාමීචිපටිපන්නො භගවතො සාවක සංඝො, යදිදං චතතාරි පුරිසයුගානි, අට්ඨ පුරිස පුග්ගලා ඒස භගවතො සාවක සංඝො, ආහුනෙය්‍යො, පාහුනෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයෙය්‍යො, අනුත්තරං පුඤ්ඤක්කෙත්තං ලොකස්සාතී.

The Sangha of the Exlted One's disciples -(followers/ devotees)-

- has entered the **true path** and is parcticing well
- has entered the **straight path** and is parcticing straightly
- has entered the **correct path** and is practicing correctly
- has entered the **proper path** and is parcticing properly

The above four kinds of Sanga becomes **eight** when Paths & Fruits are regarded separately. So Sangha is worthy for **gifts, hospital-ity, offerings & reverential salutation** as the unique field of merit for the entire world.

මෙහි අදහස ද පාලි හෝ ඉංග්‍රීසි වචන වලට සීමා නොකොට විමසිලිමත්ව නුවණින් දැකිය යුතුමය. බුදුරජාණන් වහන්සේ ගැනත්, උන්වහන්සේ දේශනා කර වදාල ශ්‍රී සද්ධර්මය ගැනත් පැහැදුණ ශ්‍රාවක සංඝ රත්නය මනා

ලෙස ප්‍රතිපත්ති ධර්මයට අවතීර්ණ වූ හෙයින්, එනම් ආර්ය අෂ්ඨාංගික මාර්ගයට ප්‍රවිෂ්ඨව සන්සුන්ව යහපත් ප්‍රතිපත්ති වඩනා හෙයින් **සුපටිපන්න** වන බව අප විසින් අවබෝධ කර ගත යුතු ය. **උජුපටිපන්න** යනුවෙන් හඳුන්වනු ලබන්නේ එකී ප්‍රතිපත්ති හදවතට එකඟව අවංකවම සෘජුව ආරක්‍ෂා කිරීමේ ගුණයයි. සංඝයා වහන්සේලා විසින් මෙලෙස නිර්වාණ මාර්ගයේ ප්‍රතිපත්ති පුරණ හෙයින් **ඤායපටිපන්න** ගුණය ද උන්වහන්සේලා සතුය. **සාමීචිපටිපන්න** යනුවෙන් අදහස් වන්නේ ගෞරවයට පාත්‍ර විය යුතු යහපත් ප්‍රතිපත්ති පිරීම නිසා සිව්පස ලැබීමට සුදුසු වීම යන්නයි. බුදුරජාණන් වහන්සේ දේශනා කල ධර්මානු ධර්ම ප්‍රතිපත්ති නිසි ලෙස පුරමින්, සෝවාන් **මඟට ප්‍රවිෂ්ඨ වීමට** වීර්ය කරන පුද්ගලයාගේ පටන් සතර මඟ සතර ඵල ලබමින් **අරහත් ඵලය ලබාගැනීම** දක්වා වූ අදියර 8 හි සිටින්නා වූ අෂ්ඨ පුද්ගලයන් **යදිදං චතතාරි පුරිසයුගානි, අට්ඨ පුරිස පුග්ගලා** යනුවෙන් මෙම ගාථා පාඨයෙන් හඳුන්වනු ලබයි.

ගාථා පාඨයේ එන **ආහුණෙය්‍ය** යනුවෙන් හඳුන්වනු ලබන්නේ දුර සිට වුවද ගෙන එන්නා වූ සිව්පස පිළිගැනීමට සංඝයා වහන්සේලා සුදුසු බවයි. **පාහුණෙය්‍ය** ගුණයෙන් අදහස් වන්නේ විශේෂයෙන් සකස් කරනු ලැබූ ආහාර පාන වුවද පිළිගැනීමට සුදුසු බවයි. **දක්ඛිණෙය්‍ය** යනුවෙන් අදහස් වන්නේ මිය ගිය අය වෙනුවෙන් දෙන දානයක් මෙන්ම පරලෝ සැප පතා දෙන දානයක් වුවද පිළිගැනීමට සංඝ රත්නය සුදුසු බවයි. **අඤ්ජලිකරණීය** යනු යහපත් වූ ප්‍රතිපත්ති නිරතුරුවම වඩන හෙයින් දොහොත් මුදුන් තබා වැඳීමට සුදුසු බවයි. **අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං** යනුවෙන් අදහස් වන්නේ පින් නම් වූ සාරවත් අස්වැන්න ලබා ගත හැකි කෙතක් යන්නයි.

ගාථා පාඨය කට පාඩමින් කියවීමේ දී මෙම සාරවත් අස්වැන්න ලබාගත හැකි කෙතට උපමා කර ඇති මහා සංඝ රත්නයේ ගුණ සහ වන්දනීයත්වයට සුදුසු වූ සාධක හදවතින්ම දැකිය හැකි නම් එතුළින්ම සාරවත් අස්වැන්නක් ලබා ගැනීම සඳහා ජීවිත සකසා ගත හැකියි.

තෙරුවන් නමැදීමේ දී පාලි පාඨයේ උච්ඡාරණය පමණක් අරමුණු කර නොගෙන මෙලෙස ත්‍රිවිධ රත්නයේ අනන්ත වූ ගුණ සමුදාය අර්ථ රසයෙන් යුතුව හදවතට ගන්නේ නම් එතුළින් අති විශාල සැනසීමක් ඇතිවනවා මෙන්ම ත්‍රිවිධ රත්නයෙන් ඔබ්බට කිසිදු සරණක්, සංසාරගතව සිටින අපහට නොමැති බව ද පසක් වනු ඇත. ඒ අනුව ජීවිත සකස් කර ගැනීම දෙලොවටම යහපත උදා කරයි.

II. ගුරු දෙගුරු නමැදීම

දෛනිකව, උතුම් ත්‍රිවිධ රත්නය නමැදීමත්, ගුරු දෙගුරුන් නමැදීමත් නිසි ලෙස පුරුදු පුහුණු කර ඇත්තේ නම් එතුලින් ලැබිය හැකි සැනසීම අති විශාල වන අතර මෙලොවදීම සෞභාග්‍යය උදාවන්නේමය. නිරතුරුවම වන්දණීයත්වයට පාත්‍ර වන, බාල පරම්පරාව යහ මඟටම යොමු කරවන ගුරුවරු, දෙමාපියන් ආදීන්ගේ ශ්‍රේෂ්ඨ ගුණාංග හදවතින්ම දකිමින් ඔවුන්ගේ දෙපා නමැදීම දෛනිකව තම ජීවිතයට එක් කරගත් බොදු දරුවන් ගේ ජීවිත දිනෙන් දිනම සෞභාග්‍ය කරා යොමු වනු දැකීම ගුරු දෙගුරුන්ගේද සුවිශාල භාග්‍යයකි.

එහෙත් නවීකරණය වෙමින් පවතින වත්මන් සමාජයේ ඇතැමුන් විසින් මව් - පිය, ගුරුවරුනට නිසි ආකාරයට ඇමතීම පවා ගිළිහී යන ආකාරය ඉතා ශෝචනීයයි. නිවසකට ගොඩ වන ඥාතියෙකු හෝ මිත්‍රයෙකු **දුව**... එසේත් නැතිනම් **පුතා**.. යනුවෙන් දරුවන් අමතා.... අම්මා කෝ? එසේත් නැතිනම් ... තාත්තා .. කෝ? යනුවෙන් විමසන අවස්ථාවලදී ... **එයා** කොහාටද ගිහිල්ලා.. නැතිනම් **එයා** වැඩක්ද කොහෙද... එසේත් නැතිනම් ... **එයා** දැන් එයි. ... ආදී වශයෙන් ප්‍රතිචාර දක්වමින්, **උත්තරීතර මාතෘත්වය සහ උත්තරීතර පීතෘත්වය, එයා - මෙයා වැනි හුදු අක්ෂර දෙකක් හමුවේ අවතක්සේරු කිරීමට තරම් සාහසික වූ සමාජයකට ගුරු දෙමාපියන්ගේ නිහඬ හදවත් තුළින් උතුරා හැලෙන ආශිර්වාද ඔස්සේ ගලා එන්නාවූ සෞභාග්‍ය උරුම වේද?**

අප මහ බුදුරජාණන් වහන්සේ පරම සුන්දර නිර්වාණ ධර්මය අවබෝධ කරගනිමින් අති උත්තරීතර බුද්ධත්වයට පත්වීමට පවා භාග්‍ය සම්පන්න වීමට

සිය මෑණියන්ගෙන් එක්තරා භවයක දී ලැබුවා වූ **නියත විවරණ** හේතු වූ බවට බෞද්ධ ඉතිහාසය සාක්ෂි දරයි. තමන් වහන්සේ කෙතරම් ශ්‍රේෂ්ඨත්වයට පත් වුවද, ඒ සම්මා සම්බුදු පදවිය ලැබීමෙන් අනතුරුව **පළමුකොටම තමාට ශිල්ප ශාස්ත්‍රය ලබාදුන්** පස්වග තවුසන් සොයාගිය බවද බෞද්ධ ඉතිහාසයේ සඳහන් වෙයි.

මෙම ශ්‍රේෂ්ඨ බොදු ගුණාංග හදවතින් දකිමින් දෛනික ජීවිතයට එම යහගුණ ආදර්ශයක් කරගත හැකිනම් ගුරු දෙගුරු නමැදීමේ දී පවා අපට බුදුරජාණන් වහන්සේ දෘෂ්‍යමාන වනු ඇත.

තම දෘෂ්ඨිකෝණයට අනුව දෙමාපියන්ගේ අඩුපාඩු හෝ කවර තරමේ වරදක් හෝ යමෙක් දුටුව ද අපට මෙලොව මනුෂ්‍යත්වය උරුම කර දුන් ගෞරවය අපි ඔවුන් කෙරෙහි තැබිය යුතුමය. අප සංසාරයේ අතරමංව සැරිසරද්දී කුළුණු ගුණයෙන් පිරි හදවතින් අප කෙරෙහි වූ අසීමිත සෙනෙහසින් යුතුව දස මසක් කුස තුළ හොවාගෙන ආරක්ෂිත ලෙසින් අපට ජීවය ලබා දුන් මෑණියන්ට අපි සදා ණය ගැති වෙමු. උපන් දා සිට තම දිවි පරදුවට තබා අප පෝෂණය කරමින්, යහගුණ පුරුදු පුහුණු කරවමින් නිසි අධ්‍යාපනයක් ලබා දීමට අප දෙමාපියන් කෙතරම් වෙහෙසෙන්නට ඇත්ද? අපගේ සියළු අවශ්‍යතාවයන් සපුරාලීමට කෙතරම් කැප කිරීමක් කරන්නට ඇත්ද? ආර්ථික සමාජයීය අභියෝගයන් හමුවේ අපගේ යහපත වෙනුවෙන් කෙතරම් පීඩා විඳින්නට ඇත්ද? එවන් වූ දෙමාපියන්ගේ සිතට වචනයකින් හෝ වේදනාදීම බුදු දහමේ පෙන්වා ඇති අන්දමට **විශාල පාපයකි**. සංසාර සාගරයෙන් එතෙර වීම පිණිස පින් දහම් කර ගත හැකි මිනිස් ආත්මයක් අපට ලබාගැනීමට මූලාරම්භය සකස් කර දුන් දෙමාපියන්ට නිරතුරුවම අපගේ ආදරය, කරුණාව හා ආරක්ෂාව ලබා දිය යුතුමය. **එය අපගේ වගකීම මෙන්ම යුතුකමද වන්නේය. එම වගකීමෙන් මනුෂ්‍යත්වය ලද කිසිවෙකුට ඉවත් විය නොහැකි බව සිහිකටයුතුමය.**

අප කුස පිළිසිඳි දා පටන් එම මනුෂ්‍ය ආත්මය අපට නිරෝගී ලෙසින් උරුම කර දීමට මවක විසින් කරනු ලබන කැපකිරීම් අති ශ්‍රේෂ්ඨය. දරුවාට සිදුවිය හැකි අහිතකර බලපෑම් වලක්වාලීමේ චේතනාවෙන් කුසට ලබාගත හැකි රසවත් ආහාර පානාදිය පවා ප්‍රතික්ෂේප කරන මව සිය සිතුම් පැතුම් අවශ්‍යතා සියල්ල සෑම අදියරකදීම දරුවාගේ පහසුව හා යහපත වෙනුවෙන් කැප කරමින් දරුවා වෙනුවෙන් වේදනා විඳ දරාගන්නා බොහෝ අවස්ථා ඇති බවට අප දැනුවත් විය යුතුමය.

අප මොලොව එළිය දුටු විගස අපගේ කුසගින්න නිවා ලීම පිණිස මවගේ රුධිරය කිරි බවට පත් කරලීමේ ආශ්චර්යය, උතුම් සෙනෙහසේ නාමයෙන්ම හදවතට ගලා එන්නා වූ ප්‍රාභාශ්වර සිතුවිලි සමුදායේ උත්තරීතර භාවයෙන් විනා නූතන තාක්ෂණයෙන් නොවන බව ඉතා පැහැදිලි වූ සත්‍යයකි.

මාතෘත්වය ලැබූ ඇය කුමන තරමේ ශාරීරික, ආර්ථික, ආධ්‍යාත්මික හා සමාජයීය අසමතුලිත වාතාවරණයක සිටියේ වුවද, හදවත උතුරා යන දරු සෙනෙහසේ නාමයෙන් කුස ගින්නේ හඬන **අපගේ කුස තුලට ලබාදෙන පළමු කිරි උගුර** අපට මිළ කල නොහැකි අතර **සදානුස්මරණීය** වනු ඇත. නැවුම් ආත්මයක් ලබා සංසාරගත වූ අපට ඒ මොහොතේ තම සදාදරණීය මෑණියන්ම මිස අන් කවරකුගේ සරණද?

අප මහ බුදුරජාණන් වහන්සේ මව් පියන් බ්‍රහ්ම යනුවෙන් ද, පූර්වාචාර්ය වරයන් වශයෙන් ද හඳුන්වා දී ඇත. දුර කතරක සිට නමුත් ආහාරාදිය ගෙනදීම සුදුසු හෙයින් ආහුනෙය්‍ය ලෙසද දැක්වෙන අතර ඔවුහු නිරන්තරයෙන්ම දරු පරපුරටම අනුකම්පා කරන්නෝ වෙති.

බ්‍රහ්මාති මාතා පිතරෝ - පුබ්බාචරියානි වුච්චරේ
ආහුණෙයාව පුත්තානං - පජාය අනුකම්පකා

බෞද්ධ ඉතිහාසයේ සඳහන් වන **ගෙදර බුදුන් - අම්මා** යන බෞද්ධ සංකල්පය එදා සමාජයේ මෙන්ම වත්මන් ලෝකයේත් අනාගත පරපුරේත් අභිවෘද්ධිය වෙනුවෙන් බොදු හදවත් තුල පතිත විය යුතුම ය. බෞද්ධ ඉතිහාසයේ කථා පුවත් වලට අනුව, මවගේ ආශිර්වාදය උතුම් කොට සැළකූ අටවන අග්බෝ රජ, රාජ සභාවට පිවිසීමට පෙර සිය මෑණියන් නැහැවූ ජලයෙන් මුව දෝවනයකරගත් බව අනාවරණය වේ.

බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීමට අනුව ත්‍රිවිධ සරණ යාමෙන් අනතුරුව ජීවිතාන්තය දක්වාම, සසර සැරිසරණතාක් කල් අපි මාපිය නැමදිය යුතුමය. බුදුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ඔබ ප්‍රඥාවෙන් දුටුවේ නම් දෙමාපියන් ජීවතුන් අතර නොමැති වුවද, ඔවුන්ගේ අපරිමිත වූ කාරුණික ගුණ කඳ ඔබට දෘෂ්‍යමාන වනු ඇත. ඔබ වෙත ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය හා ආරක්ෂාව ලැබී ඇති විට ඒ මත මාපිය ආශිර්වාදය ද පතිත වීමෙන්, ඔබට ලැබෙන්නා වූ ආරක්ෂාව ඉතා දෘඪ වනු ඇත. කර්මානු රූපව කිසියම් උපද්‍රවයකට මුහුණ දීමට සිදුවුවද, දෘඪ වූ එම ශක්තියේ බලයෙන් සිදුවීමට තිබූ විපත් අවම කෙරෙන අතර ඔබ විසින් කරන කියන සිතන පතන සෑම දෙයක්ම, ඔබටම අදහාගත නොහැකි යහපත් ආකාරයකට ඉෂ්ඨ සිද්ධ වනු ඇත.

මවට සහ පියාට වැඳීමේ පාලි ගාථා පාඨ, අපි ළදරු අවධියේ සිටම හඳුනාගෙන ඇත්තෙමු. ඉතා හොඳින් මුවගට හුරුවී ඇති අතර, දස දහස් වාර ගණනක් සවනට ඇසී ඇත. නෙතට ගෝචර වී ඇත. එහෙත් අපි එහි අර්ථයද හදවතින් දැක මව් පිය නමදිමු.

දස මාසේ උරෙ කත්වා - පෝසෙති වුද්දි කාරනං
ආයු දීඝං වස්ස සතං - මාතු පාදං නමා මහං

Mother,

I worship the feet of my mother, wishing, a long life of hundred years for protecting me within the womb for ten months and for bringing me up well.

මෑණියනි,

දස මසක් කුස තුළ හොවාගෙන මා ආරක්‍ෂා කරමින් පෝෂණය කලා වූ මාගේ මෑණියනි, සියක් වසරක් ආයු සම්පත්තිය ප්‍රාර්ථනා කරමින් මම ඔබගේ දෙපා නමදිමි.

වුද්ධිකාරෝ අලිංගිත්වා - චුම්බිත්වා පිය පුත්තකං
රාජ මජ්ඣධං සුපතිට්ඨං - පීතු පාදං නමා මහං

Father,

I worship the feet of my father, who kissed & cuddled me and also placed me among kings with my welfare at heart.

පියාණෙනි,

මාගේ යහපතම හදේ රුවාගෙන පිය සෙනෙහසින් මා සිප වැළඳ ගනිමින් මා ශ්‍රේෂ්ඨයින් අතර තැබුවා වූ පියාණෙනි, මම ඔබගේ දෙපා නමදිමි.

මා පිය නමැදීමේ දී මෙම යථාර්ථවාදී අදහස අපගේ හදවත් වෙලා ගන්නේ නම් නිසි ලෙස මව් පිය නමැදීම සිදු වී ඇති අතර ඔවුන්ගේ හදවත් තුළින් සෙනෙහසේ නාමයෙන් ගලා එන්නා වූ ආශිර්වාද මඟින් අපගේ ගමන් මග ඒකාලෝක වනු ඇත.

බුදුන් වහන්සේගේ ඉගැන්වීමට අනුව, අද මව් පියන්ගේ රූපකාය අප අතරේ නොමැති වුවද කල යුත්තේ, මව් පිය ගුණ හා ළබැඳි සෙනෙහස සිහිපත් කරමින්, සමාජයේ උදව් උපකාර අවශ්‍ය කවරෙකු හෝ සොයා බලා ඔවුන් වෙත කරුණා පෙරදැරිව උපකාර කිරීමයි. ඔවුන්ගේ සිත් සතන් මොහොතකට හෝ සැනසීමයි. අසරණ වී ඇති මවක් තම මෑණියන් සේ දැකිය හැකි නම්, එවන් පියෙකු තම පියා සේ දැකිය හැකි නම් එවිට ඇති වන මෛත්‍රී සහගත සිතුවිලි තුළින් ලැබෙන්නා වූ නිරාමිස ප්‍රීතිය අපමණය. මෛත්‍රී වැඩීමේ ආනිශංස නොදැනුවත්වම අප්‍රමාදව තමා කරාම ගලා එන්නේමය. **එහෙත් බුද්ධ ධර්මය අඥාණයින් සඳහා දේශනා කරන ලද ධර්මයක් නොවන හෙයින් මෙහි සත්‍ය තාවය නිර්ණය කිරීමට ඔබගේ බුද්ධියටම භාර කිරීම වටී.**

මව් පියන්ට සැළකීම වැනි දේ ප්‍රායෝගිකරණය කිරීම තුළින් **බුද්ධාලම්භන** ප්‍රීතියක් ලැබිය හැකියි. ඒ සඳහා අවශ්‍ය වන්නේ මව් පිය ගුණ හදවතින් දැක ඇප උපස්ථාන කිරීම සහ ඔවුන් සැනසීමයි. එසේ නොමැතිව බාහිර ලෝකයාට පෙන්වීමේ අරමුණෙන් කරන්නා වූ සත්කාර ගරු සැලකිලි තුළින් නිරාමිස සතුටක් හෝ ප්‍රීතියක් ලද නොහැක්කේමය. බුද්ධ දේශනයට අනුවම ලියැවුණු ධම්ම පදයේ, නාග වර්ගයේ 332 ගාථා පාඨයට අපගේ අවධානය යොමු විය යුතුමය.

සුඛෝ මතෙය්‍යතා ලෝකෙ - අතො පෙතෙය්‍යතා සුඛා
සුඛා සාමඤ්ඤතා ලොකෙ - අතො බ්‍රහ්මඤ්ඤතා සුඛා

(332 ධම්මපදය)

මෙම ගාථා ධර්මයෙන් පෙන්නුම් කර ඇත්තේ - මවට පියාට කරන උපස්ථානය වනාහි ලොව ඇති උතුම්ම සැපය බවත් භික්ෂූන් වහන්සේලා සහ බුද්ධාදි උතුමන් වෙනුවෙන් කරන්නා වූ සත්කාර වූ කලී ඒ හා සමාන සැපයන් බවත්ය. **එවන් වූ සතුටක් සැපයක් නිසි ලෙසින් ලබන්නා - බුද්ධ - යන වචනය අරමුණු කරගත්තා වූ බුද්ධාලම්භන ප්‍රීතියෙන් ඔද වැඩී යනු ඇත. එවන් ප්‍රීතියක් ලද්දේ නම් නිරන්තරයෙන්ම අයෙකු බුදුන් දැක්කේ වෙයි.**

12. ත්‍රි ලක්ෂණය සහ නිවන් මග

මිනිසාගේ බුද්ධි මට්ටම් විවිධ බව අපි දනිමු. ඇතැම් විට යමක් ඇසූ පමණින්ම අවබෝධ කර ගත හැකි අය මෙන්ම කිහිප වතාවක් ශ්‍රවණය කිරීමෙන් අනතුරුව සිතා බලා අවබෝධ කර ගන්නා අයද අප අතර වෙයි. බුද්ධ ශාසනයෙහි වහා දහම් අවබෝධ කල භික්ෂුණීන් අතුරෙන් අග්‍රස්ථානයට පත් වූ භද්‍රා කුණ්ඩලකේසා තෙරණිය රහත් බවට පත්වූයේ අප බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද පද හතරකින් යුත් එක් ගාථා ධර්මයක් මනා ලෙස ශ්‍රවණය කර අවබෝධ කරගැනීමෙන් බව බෞද්ධ ඉතිහාසයේ සඳහන් වේ. එක් ගාථා පාඨයක් හෝ මනා සේ අවබෝධ කර ගන්නේනම් එය ඉතා ශ්‍රේෂ්ඨ බව ධර්මයේම පෙන්වා දී ඇත.

සහස්සම්පි වෙ ගාථා - අනත්ථ පද සංහිතා
එකං ගාථා පදං සෙය්‍යො - යං සුත්වා උප සම්මති

අපගේ වටිනා ජීවිත වඩා සුන්දර කර ගැනීමට නම් අපි ධර්මාවබෝධයක් ඇති අය දෙසටම සමීප විය යුතුමය. ජලය නොමැති කමෙන් වියලී ගිය පොළව තෙත් වන්නාක් මෙන් සදහම් සිසිල නොලද හදවත් ගුණ දම් අවබෝධයත් සමඟ දහම් සිසිලෙන් නැහැවෙනු ඇත. නපුරු අධම සිතුවිලි වලින්ම හදවත් පුරවාගෙන අන් අයගේ දියුණුව දරා ගත නොහැකිව ද්වේශ සහගතව, ජීවිතාලෝකය ලැබීමට ආත්මාවබෝධයක් නැති, බුද්ධ ධර්මය පහසුවෙන් ගෝචර නොවන, අන්ධබාලයින් ගේ ඇසුරෙන් ඈත්විය යුතුමය. එසේ නොවන අවස්ථා වලදී, යකඩයක බැඳුණු මල මගින් එම යකඩය විනාශ

කරන්නා සේ නපුරට සිත යොමු වූ තැනැත්තා තම නපුරු සිත මගින් ම දිනෙන් දින විනාශ මුඛය කරාම ඇදී යන අතර මළ බැඳුණු යකඩය මගින් එය ස්පර්ශ වෙමින් පවතින අනිකුත් දෑ ද විනාශ වන්නා සේම ආශ්‍රිතයන්ගේ විනාශයද වැලැක්විය නොහැක්කේමය.

අප ශාන්ති නායක බුදුරජාණන් වහන්සේ එක්තරා දිව්‍ය පුත්‍රයෙකුගේ ආරාධනය පරිදි එදා ජේතවනාරාමයේ දී දෙව් මිනිසුන් ගේ යහපත පිණිස දේශනා කොට වදාළ, මංගල සූත්‍රයේ එන මූලික ගාථා පාඨය දෙස බලමු....

අසේවනාච බාලානං - පණ්ඩිතානංච සේවනා
පූජාච පූජනීයානං - ඒතං මංගල මුත්තමං

අඥාණයින් ඇසුරු නොකිරීමත්, බුද්ධිමතුන් ඇසුරු කිරීමත්, පිදිය යුත්තන් පිදීමත් මංගල කරුණු ලෙසින් සූත්‍ර දේශනාව ආරම්භයේ දීම පෙන්වා දී ඇති ආකාරය අද සමාජයට කෙතරම් උචිතද? උන් වහන්සේ ගේ ශ්‍රී මුඛයෙන් දේශනා කළ සෑම වචනයක්ම අකාලිකය. ජීවමානය.

සුදුසු ප්‍රදේශයක වාසය, පෙර කල පින් ඇතිබව, බහුශ්‍රැතබව, යහපත් වචන කථා කිරීම, මව් පියන්ට සැලකීම, අඹු දරුවන් පෝෂණය කිරීම, නිරවුල් කර්මාන්තය, දන් දීම, සීලයෙහි පිහිටීම, ඤාතීන්ට සංග්‍රහ කිරීම, නිවැරදි කර්මාන්තයෙහි යෙදීම, නපුරු අධම ක්‍රියාවන්ගෙන් වැළකීම, මත් වතුර සුරාවෙන් වැලකීම, අප්‍රමාදව කුසල් රැස් කිරීම, ගරු කල යුත්තන්ට ගරු කිරීම නිහතමානී බව, ලද දෙයින් සතුටුවීම, කලගුණ සැලකීම, නිසි කල දහම් ශ්‍රවණය, ඉවසීම, කීකරු බව, ශ්‍රමණාදී උතුමන් දැකීම, ස්වයං පාලනයක් ඇති කර ගැනීම, සත්‍ය දැකීම, නිර්වාණ ධර්මය අවබෝධ කර ගැනීම, අටලෝ දහමට කම්පා නොවීම, ශෝක නොවීම, කෙලෙස් මල නොමැති බව, ආරක්ෂිත බව මංගල කරුණු ලෙසින් බුදුපියාණන් වහන්සේ පෙන්වා දී ඇත. මෙම කරුණු යමෙකු තම ජීවිතයට ආරෝපණය කරගන්නේ නම් ඔහුගේ සෞභාග්‍යය උදා වන්නේම ය.

ත්‍රිවිධ රත්නයේ ආශිර්වාද හමුවේ විශ්ව ශක්තිය මගින් ඔහුගේ දෛනික කාර්යයන් පවා මෙහෙයවනු ලබයි. සර්ව ලෝක නීතිය මගින් ඔහු පාලනය කෙරෙනු ලබයි. ශ්‍රී සද්ධර්මයෙන් පෙන්වා දී ඇති ස්වභාව ධර්මයේ පවතින ඒ විශ්ව ශක්තිය අභිභවා යාමට මේ දක්වා කිසිදු දාර්ශනිකයෙකු හෝ විද්‍යාඥයෙකු සමත් වී නැත. විශ්වයේ පවතින සියළුම ධර්මතාවයන් බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් සද්ධර්මයේ සිද්ධාන්ත වලටම අනුරූප වන අතර ස්වභවධර්මයේ කුරිරු බලවේගයන් හමුවේ වුවද එය සනාථ වී හමාරය.

තුන් ලෝ වැස්සනට විශ්වයේ පැවැත්ම පිළිබඳව යථාවබෝධය ලබා දුන් ඒ ශ්‍රේෂ්ඨයාණන් වහන්සේට ස්වභාව ධර්මය පවා ගෞරව දැක්වූ බවට, සුනාමි ව්‍යසනයේ දී කිසිදු හානියකට පාත්‍ර නොවූ, බුදු දහමේ මුදුන් මල් කඩ සේ සලකනු ලබන ඒ ශෛලමය, ලෝහමය බුද්ධ ප්‍රතිමා හමුවේ වෙනත් කිසිම සාක්ෂියක් අවශ්‍ය නොවන්නේමය.

අන් අයගේ දියුණුව හා යහපත දෙස බලමින්, එය හදවතින් දරා ගත නොහැකිව ඊෂ්‍යා, ද්වේශ සහගත සිත් ඇති කර ගනිමින්, ඔවුන් පහත හෙළීමට හැකියැයි සිතා ඔවුන් වෙත යොමු කරන්නා වූ **(නපුරු ඇස, නපුරු වචන හෝ නපුරු ක්‍රියා)** මගින් සිදු වන්නේ තමා ආවාරණය වී ඇති මෝහන්ධාකාර පටලය තව තවත් ඝන වීම පමණි. යා යුතු මග දෘශ්‍යමාන නොවීම නිසා සිදුවන්නේ (ගැල අදින ගොනාගේ පය අනුව රථ රෝදය යන්නාක් මෙන්) තමා පසු පසම දුක ලුහුබැඳීම පමණි.

ධම්මපදයේ ආරම්භක ගාථා ධර්මයෙන්ම මෙය මනාව පිළිඹිබු කරයි.

මනො පුබ්බංගමා ධම්මා - මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පදුට්ඨෙන - භාසති වා කරොති වා
තතො නං දුක්ඛමන්වෙති - චක්කංව වහතො පදං
(ධම්මපදය - යමක වර්ගය - 01)

බුදුරජාණන් වහන්සේ දේශනා කල ධර්මය දෙලොවටම සෞභාග්‍ය උදාකරවීමට හේතු වී ඇත. එහෙයින් මෙම ධර්මය යථානුරූපීව දැක, පෙර ආත්මභවයන්හි කරන ලද කර්මයන් අනුව මෙම ආත්ම භාවයේ දී ලබා ඇති දෛනික ජීවිත ගැටළු දෙස උපේක්ෂා සහගතව බලා, ඊට ප්‍රතිකර්ම, ධර්මය තුලින් සොයා ගැනීමට තරම්වත් ඥානය පහල වන්නේ නම් කොතරම් සෞභාග්‍යයක්ද?

එහෙත් බුද්ධ ධර්මය බුද්ධිමතුන් සඳහාම වූ ධර්මයක් වන හෙයින් ඊෂ්‍යා ක්‍රෝධ තණ්හා මාන ආදී වූ කඩතුරාවෙන් වැසී අඳුරේම සිටීමට වෙර දරන්නන්ට පහසුවෙන් ගෝචර නොවෙන්නේය. එවන් පුද්ගලයින් කෙරෙහි අනුකම්පා සහගතව බැලිය යුතු වන්නේ, ධර්මාවබෝධය යන්න තම තමාගේ බුද්ධි මට්ටම අනුවම වීර්යයෙන් ලබාගත යුත්තක් විනා කුලය, බලය, නිලය මත හා සහතික මගින් හෝ වෙනයම් ගුප්ත බලවේගයක් මගින් තවත් කෙනෙකුට ආරෝපණය කර ගත හැකි දෙයක් නොවන නිසාමය.

තමා තුල හටගත් **ශ්‍රද්ධාව** තුලින් අවබෝධයකින් යුතුව ධර්මය දකින්නෙකුට යථාර්ථවාදී ලෙසින් මෙම ජීවන චක්‍රයේ යථා ස්වභාවය දෘශ්‍යමාන

වනු ඇත. දුක පොදි බැඳගෙන සංසාරගත වූ ජන්මයෙකු මහා දුක් සයුරක ගිලෙමින්, විටෙක දරුණු සැඩ පහර වලට හසුවෙමින් හැපී හැපී, තැලී තැලී, පොඩි වෙවී ජීවන මගේ ගමන් කරනු ඇත. ධර්ම මාවතට පිළිපන් ශ්‍රද්ධාවන්තයෙකු අනතුරුව ක්‍රමයෙන් අවබෝධය තුලින් ධර්මඥාණය ලබන අතර අවසානයේදී හේතු-ඵල මත හටගන්නා සියළු සංස්කාර ධර්මයන් **අනිත්‍ය, දුක්ඛ, අනාත්ම** වශයෙන් නිවැරදිව දැක දුක්හි කළකිරෙයි.

සත්‍යය, යථාර්ථවාදීව සත්‍ය ලෙසින් දුටු විට, එය සත්‍ය ලෙසින් ප්‍රකාශ කිරීමට හෝ ලියා දැක්වීමට පසුබෑමක් අවශ්‍ය නොවන්නේ, එම සත්‍යය යටපත් කිරීමට හැකි කිසිදු බලවේගයක් විශ්වය තුල නොවන හෙයින්මය.

සත්‍යය දැකීමට බුද්ධිය විවර වූ බව අවබෝධ වනවාත් සමඟම, ඒ වූ කලී අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සියළු ලෝ සතුන් වෙත පතල වූ මහා කරුණා ගුණයෙන් යුතුව අප වෙත දායාද කල උතුම් නිර්වාන මාර්ගයම බව වැටහී යනු ඇත. ප්‍රඥා සම්පන්න වූ ප්‍රභාශ්වර වූ මනසක ඇතිවන්නා වූ මෙම සියුම් වැටහීම් ශක්තිය සමඟම, තුන් ලෝකයම ෂඩ් වනක් රැස් කිරණ මගින් ඒකා ලෝක කලා වූ, අප ලද අති උත්තරීතර සම්පත වූ, ඒ අමා මෑණියන් වහන්සේ අපගේ මනෝමය නෙතට දෘශ්‍යමානු වනු ඇත.

මෙලෙසින් බුදුරජාණන් වහන්සේගේ ධර්මකාය දැකීමට අපි මොහොතක් පාසා අප්‍රමාදව උත්සාහ ගත යුතුමය. එසේනම් දුකින් නිදහස් වන ආකාරය උගත යුතුයි. මෙම අධ්‍යයනය ස්වයං අධ්‍යයනයක් විනා ලිඛිත හෝ වාචික විභාගයක් සමත් වීමට හෝ සහතික ලබා ගැනීමට හෝ නොවන්නේමය. මෙම අධ්‍යයනයට පිළිවිසීමට වෙනත් අමතර සුදුසු කම් ද ලැබිය යුතු නැත. යෝග්‍යතා පරීක්ෂණ ද නැත. යෝග්‍යතාව නිර්ණය කරනුයේ තමාමය. ඒ සඳහා පන්ති භේද හෝ වයස සීමාවක් ද නැත. එය වූ කලී සකල ලෝක සත්වයා කෙරෙහි විවෘතව තබනු ලැබූ අති ශ්‍රේෂ්ඨ වූ අවබෝධතා කඩයිම් විභාගයයි. මෙහි තරඟකාරීත්වයක් නැත. තවඅයෙකු අභිභවා යාමට ද මෙහි ඉඩ කඩ නැත. ස්වයං අධ්‍යයනයක් - ස්වයං පරීක්ෂණයක් - හා ස්වයං නිරීක්ෂණයකින්ම සමන්විතය. දියුණු කරනු ලැබූ ප්‍රඥාව තුලින් ස්වයං නිරීක්ෂණයට එළඹියේ නම් උත්තරීතර නිගමනයට පැමිණීමට කිසිදු බාධාවක් නැත.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව පස් වග මහණුන්ට දේශනා කරන ලද **ධම්ම චක්ක පවත්වන සූත්‍රයේ** මෙම උත්තරීතර නිර්වාණ ධර්මය අවබෝධ වන ආකාරය ඉතා පැහැදිලි ලෙසින් පෙන්වා දී ඇත. ලැබුවා වූ මිනිස් ආත්මයේ උපරිම ඵල නෙලා ගනිමින් ධර්මාවබෝධය තුලින් (**චක්ඛුං උදපාදී**) නෙත් පාදා ගෙන, මනසට ආරම්මන වන රූප මගින්

විඥාණය පහලවීමෙන් (**ඤාණං උදපාදී**) පරීක්ෂණ, නිරීක්ෂණ නිගමන මත දැනුම(**විද්‍යා උදපාදී**) ප්‍රගුණ කර ගැනීමත් සමඟ මෝහය ඉවතලමින් ප්‍රඥා සම්පත්තිය (**පඤ්ඤා උදපාදී**) ලබා චතුරාර්ය සත්‍ය අවබෝධය ලැබිය හැකි අතර, අනතුරුව (**ආලෝකෝ උදපාදී**) මිනිසෙකුට ලබා ගතහැකි උත්තරීතර සැපත හෙවත් කෙලෙස් ගණ අඳුර මකාලන ප්‍රදීපස්ථම්භය, නිර්වාණ ධර්මය අවබෝධ කරගත හැකි බව සවිස්තරාත්මකව පැහැදිලි කර ඇත.

එය තුල දුක දක්නට නැත. නැවත සංසාර ගත වීමක් නැත. ලැබුවා වූ මෙම මිනිස් භවය තුලදීම දුක්ඛ, නිරෝද, ගාමිණී පටිපදා මාර්ගය වූ මැදුම් පිළිවෙත ඔස්සේ, තමා දුටු ධර්මයේම මාර්ගෝපදේශකත්වයෙන් දිවි මග ගෙන යන්නෙකුට මොලොව දියුණුව සත්‍ය වශයෙන්ම උදා වන අතර, සද්ධර්මය විසින්ම ඔහු ආරක්ෂා කරවනු ලබයි.

"ධම්මෝ හවේ රක්ඛතී - ධම්ම චාරී"

අප විසින් කලයුත්තේ වීර්යයෙන් අධිෂ්ඨාන පූර්වකව බුදුන් වහන්සේ පෙන්වා දී ඇති ඒ ප්‍රායෝගික වූ ජීවන දර්ශණය වූ ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුල ගැබ්ව ඇති ශ්‍රේෂ්ඨ ධර්මතාවයන් අපගේ දෛනික ජීවිතයට ගෝචර කර ගැනීමයි.

තෙරුවන් සරණ සිහි නුවණින් පතාගෙන
පෙරුමන් පුරණ බුදු දූ පුතු හඹාගෙන
දැහැමින් උතුම් ගුණ ඔවදන් ලබාගෙන
මැනවින් නිවන් මඟ යමු නෙත් අයාගෙන

ඉපිද මිය යන තෙක්ම සසරේ දුකම උරුමයි බදා ගන්නේ
පිබිද නෙත් හැර වෙහෙස ගනු මැන දහම් මාවත විවර වන්නේ
නිබද දුක අවබෝධ වන්නට **ශ්‍රද්ධාවයි** මුල පුරන්නේ
කිමද? ආරිය අටගි මඟ දැක තවත් අඳුරේ ලතව ඉන්නේ

එපා තව තව බලා ඉන්නට දහම් මඟ දිස්වේය දෙනෙතට
අපා දුක් සයුරේ ගිලෙන්නට තවත් ඉඩදිය හැකි ද ඔබහට
කපා බලනා විටදි සැමදේ කිසිත් නැත ඒ පැවති විලසට
මවා පෑමකි මේ සියළු දෙය යථා දැක්මක් ලබමු හනිකට

බලා ඉන්නට නොහැක මරුවා පසුපසින් එයි ගිල ගැනීමට
අගාධව සිට කවරදාවත් බැරිය මේ ලොව ජය ගැනීමට
විභාගාදිය සමත් කල මුත් - ජීවිතේ කඩඉම පැනීමට
නගා ගතයුතු දහම් සිතුවිලි - සහතිකෙන් බැහැ එය කිරීමට

අවට ලෝකයෙ දැහැමි මිනිසුන් මොලොව දිවි මග ගෙවයි කදිමට
නමට නොව මුළු හදින් පින් දම් කරයි සංසාරයේ ගමනට
පිනට ලද මේ මිනිස් භාවය තුලින් දුක් දැක කලකිරීමට
නෙතට ගෝචර වුනොත් ධර්මය, ඉලක්කය වී ඇත්තේ නිවනට

කරන කියනා සෑම දෙයකම **යථා දැක්මක්** ලැබිය යුතුමයි
එයම මත **සං කල්පනාවන්** මනා ලෙස ගොඩ නැගිය යුතුමයි
වචන මුවඟින් පිටට එන විට යහපතින් දැයි බැලිය යුතුමයි
කරන කටයුතු පවින් තොරදැයි නිතර නිතරම සෙවිය යුතුමයි

කවරදා කොයි දෙයක් කලමුත් නැත්තේය සැනසීම හදතුල
පවරලා හැම දේම නිදහස් මාවතක් ඇත බුදු කුටිය තුල
නමැඳලා තෙරුවන්ගෙ ගුණ දැක යොමා නෙත් ඔබෙ ජීවිතය තුල
සමරලා ඔබෙ **දිවිය යහපත්**, සතුටු විය හැක හැරී බල බල

කලයුතුම දෙය තමයි **වීරිය** යහපතින් අපි එල ලබන්නට
නොඑන්නට අකුසල් සිතක් හා පැමිණි අකුසල් ඉවතට ලන්නට
පහලවනවිට සිතක් ඔබහට කුසල් තව තව සිදු කිරීමට
ගත යුතුව ඇත තවත් වීරිය ලද කුසල් සිත නඟා ලන්නට

සිහිය යහපත් ලෙසින් තැබුමට භාවනායි හේතුවන්නේ
සවිය ගන්නට මෙතැනදී අපි කෙසේ හෝ සැලසුම් කරන්නේ
එඩිය පානා විටදි වෑයම නොමැත කිසිදා අතහැරෙන්නේ
වීරිය කරනා බවුන් වැඩුමයි දුවන සිත එක් තැන් කරන්නේ.

කුසල් සිත මේ අ...දි...ය...රේ...දී - අග්‍ර බවකින් බැබලී බැබලී
උපන් භවයේ නියම එල ලැබ එළිය දෙයි හැම අතට විහිදී
පහන් වූ හදවතක උපරිම සොම්නසක් සේ ඉගිලි ඉගිලී
නිවන් මඟ දැක අඳුර නිමවෙයි - නොමැත දුක යලි ඉපදී ඉපදී

ප්‍රාර්ථනා

මෙම ගෞතම බුද්ධ ශාසනය තුලදීම විශ්වයේ ඇති සියළු තතු යථා පරිද්දෙන් දැකීමට පාඨක ඔබ- අප සැමගේ බුද්ධිමය නෙත විවර වේවා !යා යුතු මග හෙළි කර ගැනීම සඳහා ශ්‍රද්ධාණ ශක්තිය පහල වේවා ! පරීක්ෂණ හා නිරීක්ෂණයන් තුලින් නිවැරදි නිගමනයන්ට අවතීර්ණ වීම සඳහා වූ පුළුල් දැනුම ලබා ගැනීමට විද්‍යාව පෑදේවා ! අවධාරණය කරගනු ලබන යථාර්ථවාදී දැනුම් සම්භාරය තුළින් ප්‍රඥාව පහල වේවා! අවසානයේ දී ප්‍රඥාවෙන් අග තැන්පත්ව දස අත විහිදුවන්නා වූ ප්‍රඥා කිරණ මගින් උතුරායන ආලෝක ධාරාවන් හමුවේ ජාතියක්, ජරාවක්, දුකක් නැති අති සුන්දර වූත්, පරම රමණීය වූත් නිර්වාණ ධර්මයම ප්‍රත්‍යක්ෂ වේවා !!!

සාධු ! සාධු !! සාධු !!!

උතුරු පළාතේ වව්නියා දිස්ත්‍රික්කයෙහි දී විසි වන සියවසේ මැද භාගයේ උපත ලද කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක, 1972 දී අම්පාර දිස්ත්‍රික්කයේ රජයේ පාසලක ඉංග්‍රීසි ආචාර්ය වරියක ලෙසින් වෘත්තීයමය ක්ෂෙත්‍රයට පිවිසියාය. දිවයිනේ විවිධ දිස්ත්‍රිකයන්හි ආදර්ශමත් ගුරු මාතාවක් ලෙසින් සේවය කරමින්, විනය ගරුක සිසු පරපුරක් ශ්‍රී ලංකාවට දායාද කල ඇය, කොල්ලුපිටිය මහානාම මහා විද්‍යාලය සහ කොළඹ ඩී. එස්. සේනානායක විද්‍යාලය යන විදුහල් හි දීර්ඝ කාලීන සේවයකින් පසු, වසර විසි පහක සේවා කාලයක් නිම කොට 1996 දී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබුවාය.

ඇය විශ්‍රාම ලැබීමෙන් අනතුරුව ද ප්‍රවීණ ඉංග්‍රීසි ආචාර්ය වරියක ලෙසින් නිහඬ මෙහෙවරක යෙදෙමින්, 1998 දී ස්වේච්ඡා සංවිධානයක් ලෙසින් කැනඩාවේ ස්ථාපිත කරන ලද අන්තර්ජාතික ශිෂ්‍යත්ව පදනමක් වූ ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනමේ ශ්‍රී ලංකා සම්බන්ධීකරණ ලේකම් ධූරයද හොබවන්නීය.

2550 ශ්‍රී සම්බුද්ධ ජයන්තිය වෙනුවෙන්, යහගුණ කැමැති සමාජයකට තිළිණ කිරීම පිණිස තම ශ්‍රේෂ්ඨ පිණාන්ගේ උදාර ජීවිත දර්ශනයන් කැටිකර - **මා පිය ගුණ සමර** - නම් වූ කෘතිය එළි දැක්වූ ඇය, ඉතාම කාලෝචිත වූ එම සමාජ සංග්‍රහය තුලින් සිය ලේඛණ කුසලතාවයන් දොරට වැඩම වූවාය.

අන්ධානුකරණයෙන් ගාථා පාඨයන් සජ්ඣායනා කරමින් තෙරුවන් නැමදීම සිදුකරනු ලබන වත්මන් සමාජයේ කවරෙකුට වුවද අර්ථාවබෝධයකින් යුතුව තෙරුවන් නමැදීම සඳහාත්, මා පිය නමැදිම සඳහාත් ඉවහල් වනසේ ඇය විසින් රචිත මෙම **-සාධූ දැක්ම- (The Excellent View)** පාඨකයින්ගේ ධර්මාවබෝධය සඳහාම වන්නේය. ඉංග්‍රීසි හා සිංහළ ද්විභාෂාවන්ගෙන් ඉතා සරලව අර්ථය පැහැදිලි කරමින්, මෙවැනි ධර්ම ග්‍රන්ථයක් එළි දැක්වීමට ඇය විසින් දරණු ලැබූ මෙම ප්‍රයත්නය ඉතා ප්‍රශංසණීය වන අතර එය කාලීන ශාසනික මෙහෙවරකි.

බී. ජී. කරුණාරත්න
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යංශය.

ISBN 978-955-50082-1-1

Rs 60/=